PGIE
POST GRADUATE
INSTITUTE OF
ENGLISH

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

# 2012

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## 2012

## අන්තර්ගතය


1. **දැක්ම**

2. **මෙහෙවර**

3. **අධ්‍යක්ෂ සහ ජ්‍යෝෂ්ඨ කළමනාකරණය පිළිබඳ කෙටි විග්‍රහයක්**

   **(අ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාජිකයෝ**

   (i) කළමනාකරණ මණ්ඩලය

   (ii) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

   (iii) ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

4. **අධ්‍යක්ෂ සමාලෝචනය**

   (අ) කෙටි හැඳින්වීම

   (ආ) ජයග්‍රහණයන්

   (ඇ) ශිෂ්‍ය තොරතුරු

   (ඈ) අපොහොසත් වීම සහ සාධාරණීකරණය

   (ඉ) අනාගත සැලසුම්

5. **අධ්‍යක්ෂ වාර්තාව**

6. **සංශෝධිත මූල්‍ය ප්‍රකාශනය** (නව සැකැසුම අනුව)

7. **විගණන කමිටු වාර්තාව**

8. **විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනය**

9. **විගණකාධිපතිවරයාගේ වාර්තාව**

10. **විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු**


## 1. දැක්ම

පශ්චාද් උපාධි අධ්‍යාපනයේ නායකයෙකු වීම සහ දේශීය හා ගෝලීය අවශ්‍යතාවන්ට සහ ප්‍රවණතාවන්ට සරිලන පරිදි නිර්මාණශීලී සහ සන්දර්භීය මූලාරම්භයන් සඳහා මං විවර කරන්නා වූ ශ්‍රී ලාංකේය ඉංග්‍රීසි අධ්‍යයනයේ සහ අධ්‍යාපනයේ ප්‍රමුඛයෙකු වීම.

## 2. මෙහෙවර

පර්යේෂණ, ගුරු අධ්‍යාපන, නව සොයා ගැනීම් සහ ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය සම්බන්ධ විශේෂ ශිෂ්‍යත්ව, ස්වයං මූලික හා ස්වයං සාමර්ථ්‍ය අධ්‍යයනය තුළින් පශ්චාද් උපාධි මට්ටමේ අධ්‍යයන සඳහා අවස්ථා උදාකර දීම සහ ජාතික මට්ටමේ ඉංග්‍රීසි අධ්‍යයන සඳහා උපදේශකත්වය සැපයීම හා මෙහෙයවීම.

## 3. අධ්‍යක්ෂ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණය පිළිබඳ සංක්ෂිප්ත විස්තරය



## (අ) (i) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෝ

| | නම | තනතුර |
|---|---|---|
| 1 | මහාචාර්ය එම්. චන්ද්‍රසේකර මිය | සභාපති - ඉංග්‍රීසි පිළිබඳ ස්ථාවර කමිටුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (2011.06.14 සිට) |
| 2 | ආචාර්ය එච්. වී. එම්. රත්වත්ත මිය | අධ්‍යක්‍ෂ<br>පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2012.03.01 දින සිට) |
| 3 | ආචාර්ය ජේ. මනතුංග මයා | අංශ ප්‍රධාන,<br>ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අංශය,<br>මොරටුව විශ්වවිද්‍යාලය<br>(විවෘත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නම් කරන ලද) |
| 4 | මහාචාර්ය ජී. ඩී. ලේකම්ගේ මිය | මහාචාර්ය,ද්විතීයික හා තෘතීය අධ්‍යාපන අධ්‍යයනාංශය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය<br>(ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභාවෙන් නම් කරන ලද) |
| 5 | මහාචාර්ය එස්. වෝල්ටර් පෙරේරා මයා | මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නම් කරන ලද) |
| 6 | මහාචාර්ය නෙලුකා සිල්වා මිය | මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය,<br>කොළඹ විශ්වවිද්‍යාලය<br>(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නම් කරන ලද) |
| 7 | එස්. සත්කුණරාජා මිය | අංශ ප්‍රධාන,වාග්විද්‍යා හා ඉංග්‍රීසි සාහිත්‍ය අධ්‍යයනාංශය,<br>යාපනය විශ්වවිද්‍යාලය<br>(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නම් කරන ලද) |
| 8 | ආචාර්ය ඩී. දේවේන්ද්‍ර මිය | අධ්‍යයනාංශ ප්‍රධාන,<br>භාෂා අධ්‍යයනාංශය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 9 | ආචාර්ය එස්. ජේ. නවරත්න මයා<br><br>එස්. පී. එම්. කේ. සිරිවර්ධන මිය | ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (2010.08.01 දින සිට)<br><br>ප්‍රධාන ගණකාධිකාරී, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,<br>( උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය 2011.08.09 දින සිට) |

| | නම | තනතුර |
|---|---|---|
| 10 | මහාචාර්ය එන්. ආර්. අර්ථනායක මයා | සේවාර්පිත මහාචාර්ය, (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාවෙන් නම් කරන ලද) 2011.08.26 දින සිට) |
| 11 | ආචාර්ය ජී. කොඩිතුවක්කු මයා | වැඩ බලන සහකාර අධ්‍යක්‍ෂ ජනරාල්, භාෂා/මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය (ජාතික අධ්‍යාපන ආයතනයෙන් නම් කරන ලද 2011.07.26 දින සිට) |
| 12 | මහාචාර්ය ඩබ්. අයි. සිරිවීර මයා | සේවාර්පිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නම් කරන ලද) |
| 13 | ආචාර්ය උපාලි එම්. සේදර මයා | ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල්, (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නම් කරන ලද) |
| 14 | මහාචාර්ය නෙලුෆර් ද මෙල් මිය | මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය, (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නම් කරන ලද) |
| 15 | එච්. එම්. එන්. එස්. ගුණවර්ධන මිය | අධ්‍යක්ෂ ජනරාල්, නීති කටයුතු දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය (මහා භාණ්ඩාගාරයේ නියෝජිත) |

## (ii) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෝ

| | නම | තනතුර |
|---|---|---|
| 1 | ආචාර්ය එච්. වී. එම්. රත්වත්ත මිය | සභාපති, අධ්‍යක්ෂ/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2012.03.01 දින සිට) |
| 2 | මහාචාර්ය එම්. ගුණසේකර මිය | මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, පීඨාධිපති - පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය |
| 3 | ආචාර්ය රධිකා ද සිල්වා මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 4 | ආචාර්ය වී.වී. මැදවත්තේගෙදර මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 5 | ආචාර්ය ඩබ්. එම්. සෙනෙවිරත්න මිය | පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, (නිල බලයෙන් සාමාජික) |
| 6 | එල්. කේ. කුමාරණතුංග මිය | බාහිර කථිකාචාර්ය, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි අංශයේ හිටපු අධ්‍යක්ෂ |
| 7 | පී. නාගසුන්දරම් මෙණවිය | හිටපු ඉංග්‍රීසි අධ්‍යයනාංශ ප්‍රධාන, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ බාහිර කථිකාචාර්ය |
| 8 | එච්. ඩී. විජේසේකර මිය | ශිෂ්‍ය නියෝජිත (2011.05.26 දින සිට) |
| 9 | එස්. ක්‍රිෂ්ණමූර්ති මයා | ශිෂ්‍ය නියෝජිත (2011.05.26 දින සිට) |

## (iii) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෝ

| | නම | තනතුර |
|---|---|---|
| 1 | ආචාර්ය එච්. වී. එම්. රත්වත්ත මිය | සභාපති, අධ්‍යක්ෂ/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2013.03.01 දින සිට) |
| 2 | මහාචාර්ය නෙලුෆර් ද මෙල් මිය | මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 3 | මහාචාර්ය නෙලුකා සිල්වා මිය | අධ්‍යයනාංශ ප්‍රධාන, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 4 | මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මිය | මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය |
| 5 | ආචාර්ය ඩී. දේවේන්ද්‍ර මිය | අධ්‍යයනාංශ ප්‍රධාන, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 6 | ආචාර්ය කේ. වර්ණපාල මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 7 | ආචාර්ය ලක්ෂ්මි ද සිල්වා මිය | හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 8 | ආචාර්ය ඩබ්. එම්. සෙනෙවිරත්න මිය | පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (නිල බලයෙන් සාමාජික) |

## 4. අධ්‍යක්ෂ සමාලෝචනය

### (අ) කෙටි හැඳින්වීම

සැලකිය යුතු කාලයක් තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වැඩ බලන කාර්ය මණ්ඩලය මගින් පරිපාලන කටයුතු සිදු කරන ලද පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා 2012 දෙවෙනි කාර්තුවේ සිට පූර්ණ කාලීන පරිපාලන කාර්ය මණ්ඩලයක සේවය ලැබුණි. දීර්ඝ කාලයක නැවතුමකින් පසු පරිපාලන තනතුරු පිරවීමත් සමඟ මෙම ආයතනයේ අනාගත සංවර්ධන සැලසුම්, නව සංයුක්ත සැලසුම (2013-2017), ක්‍රමෝපාය සැලසුම සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා ගොඩනැගිල්ලක් සාදා ගැනීම යන සැලසුම් ක්‍රියාත්මක කළ හැකි විය.

2012 ජූනි මස දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා පොත් තබන්නා සහ පරිගණක යෙදවුම් සහකාර තනතුරු දෙකක් අනුමත විය.

2012 ජූනි මස 22 වෙනි දින පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට රාජ්‍ය ගිණුම්කාරක සභාව (COPE) ඉදිරියේ පෙනී සිටීමට සිදු විය. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ අධ්‍යයන කටයුතු වසර තුළ දී නියමාකාරයෙන් සිදු විය. ඉගැන්වීම, උපදේශකත්වය, පරීක්ෂණ කටයුතු හා ඇගයීම් යනා දී කටයුතු පෙර සේම ඉටු කරන ලද්දේ බාහිර කථිකාචාර්යවරු මගිනි. එසේ වූයේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සතුව ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැති වීමේ හේතුවෙනි.

මෙම වසර තුළ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සහ එහි ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවට අදාළ මූලික සංකල්පමය කටයුතු සහ යෝජනාවලිය සැකසීම සිදු කරන ලදී. එසේම පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් විමර්ෂණාත්මක සාහිත්‍යය අධ්‍යයන කුසලතා පිළිබඳ කෙටි කාලීන පාඨමාලාවක් (Short Course on Critical Literary Reading Skills) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ ශ්‍රේණිවල ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරුන් සඳහා ක්‍රියාත්මක කෙරිණි.

2012 වසර සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් සැලසුම් කරන ලද අධ්‍යයන කටයුතු කෙසේ හෝ ප්‍රමාද වූයේ මෙම වසර තුළ ක්‍රියාත්මක වූ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග තුනක් හේතුවෙනි.

(අනධ්‍යයන කාර්ය මණ්ඩල, පරිපාලන කාර්ය මණ්ඩල සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයන්හි වෘත්තීය ක්‍රියාමාර්ග) මේ හේතුවෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා ස්වකීය උපරිම ශක්තියෙන් යුතුව දින 89 ක කාලයක් වැඩ කිරීමට අපහසු විය.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය තම ප්‍රාථමික ඉලක්කයන් සඳහා දැඩි කැපවීමකින් ක්‍රියා කළ අතර ජාතික විශ්වවිද්‍යාලයන්හි ඉංග්‍රීසි ඉගැන්වීමෙහි යෙදී සිටින ආචාර්යවරු සහ අනෙකුත් ප්‍රධාන ජාතික හා පෞද්ගලික ආයතනවල ඉංග්‍රීසි ඉගැන්වීමෙහි යෙදෙන්නන් සවිබල ගැන්වීම මෙහි දී ප්‍රධාන විය. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙන් පශ්චාද් උපාධි හිමිකර ගන්නා ලද උපාධිධාරීන් මේ වන විට දිවයින පුරා පිහිටි ජාතික විශ්වවිද්‍යාලයන්හි (කොළඹ විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය) සහ උපාධි පිරිනමනු ලබන අනෙකුත් පෞද්ගලික ආයතනවල සේවයේ නිරත වෙති.

මේ වසරේ ස්වකීය පර්යේෂණ කටයුතු ආරම්භ කළ සිසුන් දෙදෙනෙක් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි ගුරු පුහුණු අධ්‍යාපනඥයන් ලෙස සේවය කරන්නෝ වෙති.

උපාධිධාරී ගුරුවරුන් සඳහා වන කෙටි කාලීන පුහුණු පාඨමාලා අවස්ථා මඟින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, අදාළ ක්ෂේත්‍රයේ සේවයේ යෙදෙන වෘත්තිකයන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා නිරන්තරයෙන් පහසුකම් සැපයීමේ ක්‍රියාවලියේ යෙදී සිටියි.

### (ආ) ජයග්‍රහණයන්

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රධාන පරිපාලන තනතුරු තුන වන අධ්‍යක්ෂ, ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහ සහකාර මූල්‍යාධිකාරී යන තනතුරු මෙම වසර තුළ දී සම්පූර්ණ කෙරිණි. වසරකට අධික කාලයක් මුළුල්ලේ පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ තනතුර 2012 මාර්තු මස 01 දින සම්පූර්ණ කෙරිණ. 2011 ජනවාරි මස 03 දින සිට පුරප්පාඩු වී පැවති ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුර 2012 අප්‍රේල් මස 16 දින සම්පූර්ණ වූයේ වසරකුත් මාස හතරක කාලයකින් පසුවය. එසේම සහකාර මූල්‍යාධිකාරී තනතුර 2011 මාර්තු මස 01 දින සිට පුරප්පාඩු වී පැවති අතර 2012 අප්‍රේල් මස 30 දින සිට සම්පූර්ණ වූයේ වසරකුත් මාස දෙකක කලකින් පසුවය.

2012 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලද නව පරිපාලන කාර්ය මණ්ඩලය සමඟ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට එහි අනාගත සැලසුම් සහ ඉලක්ක සපුරා ගැනීම සඳහා වන ක්‍රමෝපායන් සැකසිය හැකි විය.

- 2013-2017 කාලය සඳහා වන ඒකාබද්ධ සැලසුම (Corporate Plan) සහ ක්‍රමෝපාය සැලසුම (Strategic Plan) සැකසිය හැකි විය. එමෙන්ම ඒවා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ද සිදු විය.

- ඒකාබද්ධ සැලසුමෙහි සඳහන් පරිදි අදාළ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පහසු වන පරිදි පහසුකම් හා ඉඩකඩ සපුරා ගනුවස් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මූලික සැලසුම් සහ ව්‍යාපෘති යෝජනාවක් සකස් කරන ලදී. එම ගොඩනැගිලි සැලසුම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අනුමත කරන ලද අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇත.

- අනධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය ක්‍රියාමාර්ග පවත්නා කාලය තුළ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය රාජ්‍ය ගිණුම්කාරක සභාව (COPE) සඳහා කැඳවන ලදී. ඒ අනුව නොයෙකුත් බාධක සහ අපහසුතා නොසලකා අදාළ ලේඛන සැකසීම හා පිටපත් කිරීම සිදු කරමින් ජලය හා විදුලිය වැනි අවම පහසුකම් පවා නොලබමින් නව පූර්ණකාලීන පරිපාලන කාර්ය මණ්ඩලය කණ්ඩායමක් ලෙස කටයුතු කරමින් අභියෝගයට සාර්ථක අන්දමින් මුහුණ දුනි.

- 2012 ජූනි මස දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා නව තනතුරු දෙකක් අනුමත විය. (පොත් තබන්නා සහ පරිගණක යෙදවුම් සහකාර යනුවෙන්) ඒ අනුව අදාළ වර්ෂය තුළ දී මෙම තනතුරු පිරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

- 2012 වර්ෂයේ දී සිසුන් හය දෙනෙක් දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ අතර පසුගිය අවුරුදුවල පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සිසුන් සමඟ සලකා බැලීමේ දී සිසුන් විසින් මෙහෙයවනු ලබන පර්යේෂණ ඉතා උසස් මට්ටමක තිබෙන බව බාහිර පරීක්ෂකයන් විසින් පෙන්වා දෙනු ලැබ ඇත. වසර අවසාන වීමේ දී තවත් සිසුහු නව දෙනෙක් (09) ඔවුන්ගේ පර්යේෂණ යෝජනා සාර්ථකව ඉදිරිපත් කොට පර්යේෂණ කටයුතු ඇරඹූහ. මේ අතුරින් පාඨමාලාව හදාරන අතරතුර රට හැර ගිය සිසුන් දෙදෙනෙක් විදේශගතව සිටිමින් ඔවුන්ගේ පර්යේෂණ කටයුතු පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මාර්ග ගත (Online) සහ ස්කයිප් (Skype) උපදේශකත්වය යටතේ පවත්වාගෙන යනු ලබයි. මේ අන්දමින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විවෘත සහ දූරස්ථ අධ්‍යාපන ඉලක්කයන් සාර්ථකව සම්පූර්ණ කරනු ලැබ ඇති අතර

අධ්‍යාපනය හදාරන්නන්හට ඔවුන්ගේ ස්ථානයක සිටිමින් තමන්ට හැකි වේලාවක දුරක සිටිමින් අධ්‍යාපනය ලැබීමට හැකියාව ලැබී ඇත.

- 2012 මැයි මස දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව සඳහා පුවත්පත් දැන්වීම පළ කළ අතර අයදුම්පත් 128 ක් අලෙවි විය. අනධ්‍යයන කාර්ය මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ලද වෘත්තීය ක්‍රියාමාර්ගයන් පවා නොතකමින් මෙබඳු අයදුම්පත් ප්‍රමාණයක් අලෙවි වූ අතර අයදුම්කරුවන් පනස් හතර (54) දෙනෙක් පාඨමාලාවට ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලැබූහ.

  ඉහත වර්ෂවල දී ද දක්නට ලැබුණු අන්දමට බඳවා ගැනීමේ තරග විභාගයේ දී සිසුන්ගේ ක්‍රියාකාරීත්වය අයදුම්කරුවන්ගේ විෂයානුබද්ධ දැනුම දුර්වල වීම සහ විචාරත්මක චින්තන ශක්තිය සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය අඩුවීම හේතුවෙන් අසතුටුදායක මට්ටමක පැවතුණි. කෙසේ වුවත් පාඨමාලාව සඳහා සිසුහු තිස් අට දෙනෙක් (38) ලියාපදිංචි වූහ. එසේම පළමු වසර අධ්‍යයන කටයුතු සම්පූර්ණ කළ සිසුන් හතලිස් පස් දෙනෙක් (45) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූහ.

- පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සහ දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ලෙස උපාධි පාඨමාලා දෙකක් සඳහා සැලසුම් සකස් කරන ලදී. මෙම පාඨමාලාව ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන එම වර්ගයේ පළමු පාඨමාලාව වන අතර විශේෂයෙන්ම ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ අවධානයකින් යුතුව ක්‍රියාත්මක වෙයි. එසේම දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම සඳහා ගුරුවරුන්ගේ කුසලතා වර්ධනය කිරීමේ අරමුණ මේ මඟින් සම්පූර්ණ කෙරෙනු ඇත.

  මේ සඳහා අධ්‍යයන මණ්ඩල, කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද අතර ජූනි මස දී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සනාතන සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරිණි. කෙසේ වෙතත් මෙය සනාතන සභාවේ සාකච්චාව සඳහා ගනු ලැබුවේ 2012 ඔක්තෝබර් මස දීය. එසේ වූයේ 2012 ජූනි මස සිට සැප්තැම්බර් මස දක්වා කාලය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් සනාතන සභා රැස්වීම් නොපැවැත්වීමේ හේතුවෙනි.

- පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් අවශ්‍යතා විශ්ලේෂණයක (Need Analysis) යෙදී අ.පො.ස උසස් පෙළ ශ්‍රේණිවල ඉගැන්වීම් කටයුතු කරන උපාධිධාරී ගුරුවරු සඳහා විචාරාත්මක සාහිත්‍ය අධ්‍යයන කුසලතා පිළිබඳ කෙටි

කාලීන පාඨමාලාවක් සකසා ඉදිරිපත් කරන ලදී. ඒ අනුව එහි ප්‍රථම කණ්ඩායම ලෙස සිසුන් 13 කින් සමන්විත ශිෂ්‍ය කණ්ඩායමක් පාඨමාලාව සාර්ථකව නිම කළහ. මෙම පාඨමාලාව ඉතා හොඳින් ක්‍රියාත්මක කරන ලද අතර ශිෂ්‍ය ප්‍රතිචාර මත පදනම්ව මෙම පාඨමාලාව නවීකරණය කොට ඊළඟ වර්ෂයේ දී ඉදිරිපත් කරනු ලැබේ. අවශ්‍යතා විශ්ලේෂණය සහ ශිෂ්‍ය ප්‍රතිචාර අනුව කෙටි කාලීන පුහුණු පාඨමාලා අවශ්‍ය වන අනෙකුත් ක්ෂේත්‍රයන් ද සඳහා ගනු ලැබ ඇත.

- පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා නවක සිසුන් බඳවා ගැනීම සහ කෙටි කාලීන පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමත් සමඟ ආයතනයේ අපේක්ෂිත ආදායම් තත්වයේ දියුණුවක් ද ඇති විය.

- පශ්චාද් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවන්හි පාඨමාලා ඒකක තුනක විෂයමාලා සංයුතිය, ඉගෙනුම් ආධාරක සහ ක්‍රමවේදය සංශෝධනය කිරීමේ කටයුතු මේ වසර තුළ සිදු කෙරිණි.
(පර්යේෂණ සන්නිවේදනය (Research Communication) පර්යේෂණ ක්‍රම හා සැලසුම් (Research Methods and Design) සහ විෂයමාලා සහ ඉගෙනුම් ආධාරක සැලසුම් කිරීම (Curruculum and Material Design) යන විෂයන්හි).

- දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ අවසන් ඇගයීම් ක්‍රමවේදය සඳහා වන Teaching Portfolio විෂය ඒකකය සඳහා 2012 වසරේ දී විවෘත විශ්වවිද්‍යාලයීය සනාතන සභා අනුමැතිය ලැබුණි. මෙම පාඨමාලාව සඳහා ඉගෙනුම් ආධාරක සැකසීම ආරම්භ කරන ලදී.

**(ඇ) ශිෂ්‍ය තොරතුරු**

2012 වර්ෂයේ දී දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාවේ පර්යේෂණ කටයුතු සම්පූර්ණ කරන ලද ශිෂ්‍යයන් අට (08) දෙනාගෙන් හය (06) දෙනෙක් උපාධි හිමිකරගත්හ. 2012 වර්ෂයේ අධ්‍යයන කටයුතු නිම කිරීමට නියමිතව සිටි සිසුන් දෙදෙනෙක් අයහපත් සෞඛ්‍ය තත්වය මත සහ රැකියාවේ වගකීම් අධික වීම හේතුවෙන් ඉගෙනුම් කටයුතු කල් දැමූහ. පළමු වසරේ ඉගෙනුම් පාඨමාලා ඒකක සියල්ල සාර්ථකව සම්පූර්ණ කළ සිසුන් නව දෙනෙක් (09) පර්යේෂණ සැසියේ දී ඔවුන්ගේ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කරන ලද අතර පර්යේෂණ කටයුතු ඇරඹූහ. මේ අතරින් දෙදෙනෙක් කැනඩාවේ පදිංචි වී සිටිති.

දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අලුතින් ලියාපදිංචි වූ සිසුන් 38 දෙනෙක් සහ පළමු වසර අධ්‍යයන කටයුතු නිම කර දෙවන වසර ශාස්ත්‍රපති උපාධි කටයුතු සඳහා නැවත ලියාපදිංචිය ලැබූ සිසුන් 45

දෙනෙක් වසර තුළ වාර්තා විය. මේ අතර විචාරාත්මක සාහිත්‍යය අධ්‍යයන කුශලතා පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව සිසුන් 13 දෙනෙකු විසින් සම්පූර්ණ කරන ලදී.

**(ඇ) අපොහොසත් වීම සහ සාධාරණීකරණය**

2012 වර්ෂය තුළ සිදු වූ අංශ තුනක වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කටයුතු දැඩි ලෙස අඩපණ විය. අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් ජූනි මස 05 දින සිට 27 වෙනි දින දක්වා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කටයුතු අඩපණ විය. අධ්‍යයනාංශ ප්‍රධානීන් තම තනතුරුවලින් ඉල්ලා අස්වීම හේතුවෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභා රැස්වීම ජූනි මස සිට සැප්තැම්බර් මස දක්වා කාලය තුළ පැවැත්වීමට නොහැකි විය. ඒ හේතුවෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන කාර්යයන් සඳහා සනාතන සභා අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය. නිදසුනක් ලෙස දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා සනාතන සභා අනුමැතිය ලබා ගැනීම මේ හේතුවෙන් ප්‍රමාද විය.

එසේම දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාවේ විභාග කටයුතු සහ ඇගයීම් කටයුතු (ප්‍රශ්න පත්‍ර සැකසීම, විභාග පැවැත්වීම, පිළිතුරු පත්‍ර ඇගයීම) අඛණ්ඩ ඇගයීම් සහ අවසන් විභාග සම්බන්ධයෙන් බලන කල කල්ගත විය. එසේම අවසන් වාචික පරීක්ෂණය (Viva-Voce Examinations) ආදිය ද වෘත්තීය සමිති ක්‍රියාමාර්ග පැවැති කාලය තුළ පැවැත්විය හැකි නොවීය.

විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය ක්‍රියාමාර්ග පැවති කාලය තුළ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ සහ විචාරාත්මක සාහිත්‍යය අධ්‍යයන කෙටි කාලීන පාඨමාලාවේ අයදුම්පත් නිකුත් කිරීම සිදු කෙරුණු අතර එය දැඩි ලෙස බලපෑවේය. කෙටි කාලීන පාඨමාලාව ආරම්භ කිරීම විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය ක්‍රියාමාර්ග හේතු කොට ගෙන කල් දැමීමට සිදු විය.

2012 වර්ෂය තුළ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා දැඩි ලෙස බලපාන ලද අනෙක් කරුණ වන්නේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට අපොහොසත් වීමය. කළමනාකරණ මණ්ඩලය මඟින් පත් කරන ලද අනුකමිටුව මඟින් තෝරා ගන්නා ලද උසස් උපාධි මට්ටමක උපදේශකත්වය පිළිබඳ සැලකිය යුතු පර්යේෂණ හා අත්දැකීම් ඇති අයදුම්කරු ප්‍රාමාණික සුදුසුකම් නොමැති වීමේ පදනම මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කෙරිණි. කෙසේ වුව ද මේ හා

සමගාමීව එම අයදුම්කරු එම සුදුසුකම් මතම කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අංශය සඳහා බඳවා ගන්නා ලදී. මේ අනුව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අභිවෘද්ධිය සඳහා මනා දායකත්වයක් සැපයිය හැකි ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයකුගේ සේවය ආයතනයට අහිමි විය. පුවත්පත් දැන්වීමක් පළ කිරීම මඟින් ඉන් අනතුරුව මැයි මස දී මෙම තනතුර පිරවීමට උත්සහා කරන ලද නමුත් සුදුසුකම් සහිත කිසිදු අයදුම්කරුවකු අයදුම්පත් යොමු කොට නොතිබිණි. ඒ අනුව තුන් වැනි වරටත් 2012 ජූලි මස දී මෙම තනතුරු සඳහා නැවත අයදුම්පත් කැඳවන ලදී.

කාර්ය මණ්ඩලයේ සහ ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීමේ ප්‍රශ්නය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය පුළුල් කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කටයුතුවලට දැඩි ලෙස බලපාන ලදී.

එළැඹෙන වසරේ දී අමතර කාර්ය මණ්ඩල බඳවා ගැනීමත් සමඟ ඉඩකඩ පිළිබඳ ප්‍රශ්නය වඩාත් සංකීර්ණ තත්වයකට පත්වෙන බව පෙනේ.

**(ඉ) අනාගත සැලසුම්**

1. දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා විවෘත විශ්වවිද්‍යාල පාලක සභා අනුමැතිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීම.

2. ඉහත සඳහන් උපාධි පාඨමාලා සඳහා නීතී රීතී හා නියමයන් සකස් කිරීම සහ අදාළ අංශයන් වෙතින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.

3. දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා අවශ්‍ය උපදේශකත්වය සපයන ඉගෙනුම් ආධාරක (මුද්‍රිත/විද්‍යුත්/ජාලගත) සකස් කිරීම.

4. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් මෙහෙයවනු ලබන දර්ශනපති (M.Phil) සහ දර්ශනසූරී (Ph.D) උපාධි පාඨමාලාවන් සඳහා සැලසුම් සකස් කිරීම සහ අදාළ අංශයන් (අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය, සනාතන සභාව, පාලක සභාව සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) වෙතින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.

5. විචාරාත්මක සාහිත්‍ය අධ්‍යයනය පිළිබඳ කාලීන පාඨමාලා වෙළඳපල අවශ්‍යතා අනුව නැවත සැලසුම් කිරීම සහ සංශෝධනය කිරීම.

6. උපාධිධාරී ගුරුවරුන් සහ අනෙකුත් වෘත්තීයවේදී උපාධි සඳහා අවශ්‍ය වන කෙටි කාලීන සංවර්ධන පාඨමාලාවන් හඳුන්වා දීම සඳහා සැලසුම් සැකසීම හා අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කිරීම.

7. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ගොඩනැගිල්ල සඳහා අදාළ ජාතික ආයතන සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය වැඩකටයුතු සම්පූර්ණ කිරීම.

8. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම.

9. අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.

10. ලිපිකාර හා පරිපාලන සහායක කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.

**(ඊ) සම්පත් හා ශිෂ්‍ය තොරතුරු**

| **ආයතනය** | **පාඨමාලාව** | **සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව** | | **සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය** | | **සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩලය** | |
|---|---|---|---|---|---|---|---|
| | | 2011 | 2012 | 2011 | 2012 | 2011 | 2012 |
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (PGIE) | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව (MA in TESL) | 37 | 30 | 01 | 01 | 03 | 03 |
| | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (PG Dip. in TESL) | 25 | **53** | | | | |
| **එකතුව** | **02** | **62** | **83** | **01** | **01** | **03** | **03** |

**(උ) දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු**

| **ආයතනය** | **පාඨමාලාව** | **මාධ්‍යය** | **2012 ශිෂ්‍ය කණ්ඩායම** | **ශාස්ත්‍රපති උපාධිය** | **පළමු වසර ශිෂ්‍ය කණ්ඩායම** | **දෙවන වසර ශිෂ්‍ය කණ්ඩායම** | **උපාධිය සමත් වූ සිසුන්** |
|---|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | - | 30 | 11 | 19 | 06 |
| | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | ඉංග්‍රීසි | **38** | - | **52** | **01** | **-** |
| **මුළු ගණන** | | | **38** | **30** | **63** | **20** | **06** |

(ඹ) අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

| ආයතනය | විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු | මහාචාර්යවරු | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු | කථිකාචාර්යවරු | ආධුනික කථිකාචාර්යවරු | උපදේශක |
|---|---|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | - | ඉංග්‍රීසි | - | - | 01 | - | - | - |
| **මුළු ගණන** | **-** | **-** | **-** | **-** | **01** | **-** | **-** | **-** |

(ඵ) අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

| ආයතනය | ජ්‍යෙෂ්ඨතම කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය | - | - | 02 | 01 |
| **මුළු ගණන** | **-** | **-** | **02** | **01** |

(ඒ) පර්යේෂණ නව සොයාගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු

| විෂය | ප්‍රකාශිත | මුද්‍රිත | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| (අ) පර්යේෂණ | - | - | 07 |
| (ආ) නව සොයාගැනීම් | - | - | - |
| (ඇ) සඟරා | 01 | - | - |
| (ඈ) පොත් | - | - | - |
| (ඉ) ශාස්ත්‍රීය ලිපි | 04 | - | - |
| (ඊ) වෙනත් | - | - | - |
| **මුළු ගණන** | **05** | **-** | **07** |

(ඓ) වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු

| විෂය | සහභාගි වූ | සම්පූර්ණ කරන ලද | මෙහෙයවන ලද |
|---|---|---|---|
| (අ) පශ්චාද් උපාධි වැඩසටහන් ගණන | - | - | 01 |
| (ආ) පශ්චාද් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් ගණන | - | - | 01 |
| (ඇ) උපාධි වැඩසටහන් ගණන | - | - | - |
| (ඈ) ඩිප්ලෝමා වැඩසටහන් ගණන | - | - | - |
| (ඉ) සහතිකපත්‍ර වැඩසටහන් ගණන | - | - | - |
| (ඊ) වෙනත් | - | - | - |
| එකතුව | - | - | 02 |

### (ඔ) අලුතින් ආරම්භ කරන ලද පාඨමාලාවන් පිළිබඳ විස්තර

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | පශ්චාද් උපාධි සහතික පත්‍ර | පශ්චාද් උපාධි ඩිප්ලෝමා | ශාස්ත්‍රපති | දර්ශනපති | දර්ශනසූරි |
|---|---|---|---|---|---|---|---|
| පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (PGIE) | දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | - | පශ්චාද් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| | විචාර පූර්වක සාහිත්‍ය අධ්‍යයන කුසලතා කෙටි කාලීන පාඨමාලාව | ඉංග්‍රීසි | පශ්චාද් උපාධි සහතික පත්‍ර මට්ටම | | | | |
| **එකතුව** | 02 | | - | - | - | - | - |

### (ඕ) මෙම වාර්තාවට අදාළ අනෙකුත් තොරතුරු/කාර්ය සාධනය

විදේශ රටවල පදිංචි ව සිටින ශිෂ්‍යයෝත් නූතන තාක්ෂණික ක්‍රමවේදයන් මගින් වාර්ෂික අධ්‍යයන පර්යේෂණ සැසිවාරයේ දී ඔවුන්ගේ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කළහ. රට හැර යන ලද අධ්‍යයනකරුවන්හට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ඉදිරියට කරගෙන යාමට මෙය මහඟු අවස්ථාවක් වන හෙයින් එබඳු අවස්ථාවන් සඳහා අවශ්‍ය කෙරෙන පහසුකම් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා යෝජිත ගොඩනැගිල්ලෙහි ස්ථාපනය කිරීම අවශ්‍ය කෙරේ.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ නියමාවලිය සඳහා නිර්දේශිත සංශෝධන සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය අපේක්ෂාවෙන් සිටියි. මෙම සංශෝධන 2011 වර්ෂයේ දී යෝජනා කරන ලදී.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිපාලන තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා දායකවීමේ හැකියාවක් නොපවතී. එමෙන්ම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණය විසින් ගනු ලබන එවැනි පරිපාලනමය තීරණ සන්නිවේදනය වීමේ ප්‍රමාදය හේතුවෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වැඩකටයුතුවලට ප්‍රබල බාධා එල්ලවිය. නිදසුන් වශයෙන් පන්තිකාමර වෙන් කරවා දීම, විභාග ශාලා පහසුකම් සපයා දීම, පුස්තකාල සාමාජිකත්වය ආදිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ගනුලැබ ඇති තීරණ මඟින් 2012 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මනා යහපැවැත්මට බාධා එල්ල විය.

දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා/ශාස්ත්‍රපති පාඨමාලාවට සිසුන් බඳවා ගැනීමේ පරීක්ෂණය 2012 ජූලි මස 27 දින ජාතික අධ්‍යාපන ආයතනයේ දී පවත්වන ලදී. එසේ වූයේ මෙම කාලය තුළ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයන්ට අවතීර්ණ වී සිටි හෙයිනි.

## 5. අධ්‍යක්ෂ වාර්තාව

2012 වර්ෂයේ දෙවන කාර්තුව ආරම්භයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්‍ෂ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහ සහකාර මූල්‍යාධිකාරී යන තනතුරු පිරවීම සිදුකරන ලදී. මේ අනුව ගත වූ වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට හැකියාව ලැබුණි.

### අධ්‍යයන ප්‍රගතිය

(අ) දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා යෝජනා සැකසීම සිදු වූ අතර පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩල සහ කළමනාකරණ අනුමැතිය ලබා ගැනීමත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභා අනුමැතිය ලබා ගැනීමත් සිදුවිය.

(ආ) දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා යෝජනා සැකසීම සිදු වූ අතර ඒ සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩල සහ කළමනාකරණ මණ්ඩල අනුමැතියත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභා අනුමැතියත් ලබා ගැනීමට හැකි විය.

(ඇ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් තිස් අට (38) දෙනෙකු බඳවා ගැනීම සිදුවිය. සිසුන් අනූහය (96) දෙනෙකු ඇතුළත් වීමේ විභාගය සඳහා පෙනී සිටිය ද පසුගිය අවුරුදුවල තත්ත්වය හා සලකා බලන කල අයදුම්කරුවන්ගේ ශක්‍යතා මට්ටම සතුටුදායක මට්ටමක නොපවතින බව පෙනේ. ඔවුන්ගේ විෂයානුබද්ධ දැනුම අඩුකම, භාෂා කුසලතා හීනවීම සහ විචාරාත්මක චින්තනය නොමැති වීම ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන් වෙතින් මූලික උපාධියක් නොමැති වීම වැනි අඩුපාඩුකම් දැකිය හැකි විය.

(ඈ) වාර්ෂික පර්යේෂණ සැසිය පවත්වනු ලැබූ අතර එහි දී සිසුන් නව දෙනෙකු (09) විසින් තම පර්යේෂණ යෝජනා ඉදිරිපත් කරන ලදී. එක් ශිෂ්‍යාවක් තම පර්යේෂණ යෝජනාව කැනඩාවේ සිට නූතන තාක්ෂණය (Skype) ඔස්සේ ඉදිරිපත් කළ අතර මෙම අත්දැකීම මඟින් විශේෂ කොට දක්වන ලද්දේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා ස්ථිර යටිතල පහසුකම් සපයා දෙන අවස්ථාවේ දී මෙබඳු කටයුතු සඳහා ද අවශ්‍ය පහසුකම් අන්තර්ගත කිරීම අවශ්‍ය බවය. ආයතනය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ දී මෙය සලකා බැලීම අවශ්‍ය කෙරේ.

(ඉ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාවේ පළමු වසර සඳහා නියමිත ඉගෙනුම් පාඨමාලා විෂය ඒකක සියල්ල සම්පූර්ණ කරන ලද සිසුන් හතලිස් පස් දෙනෙක් (45) දෙවන වසර (ශාස්ත්‍රපති උපාධිය) සඳහා නැවත ලියාපදිංචිය ලැබූහ.

(ඊ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාවේ ඉගෙනුම් ආධාරක සහ විෂය නිර්දේශ සංශෝධනය සහ යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. ඒ අනුව පර්යේෂණ ක්‍රම, පර්යේෂණ සන්නිවේදනය, විෂයමාලා සහ ඉගෙනුම් ආධාරක සැලසුම් කිරීම යන විෂයන්ට අදාළ සංශෝධන සිදු කෙරිණි.

(උ) "How to Approach the Portfolio" විෂය කොටසට අදාළ ඉගෙනුම් ආධාරක ලිවීම ආරම්භ කරන ලදී.

(ඌ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධියට අදාළව උපදේශකත්වය, පරීක්ෂණ කටයුතු සිදුකරන ලද අතර සිසුන් හය (06) දෙනෙකු උපාධි ප්‍රදානෝත්සවය සඳහා යවන ලදී.

(එ) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ සිසුන් පහළොස් (15) දෙනෙකුගේ පර්යේෂණ සඳහා උපදේශකත්වය සපයන ලදී. කෙසේ වුවද ව්‍යවහාරික වාග්විද්‍යාව විෂය ක්ෂේත්‍රයේ විශේෂ දැනුම සහිත ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන්ගේ හිඟය හේතුවෙන් ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ උපදේශකත්වයේ බර අධ්‍යක්ෂ සහ භාෂා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු තිදෙනෙකු මත පැවරිණි. මෙම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සැලකිය යුතු කාලයක් ඔවුන්ට නියමිත අධ්‍යයනාංශයන්හි ඉගැන්වීම් කටයුතු, ශිෂ්‍ය ඇගයීම් කටයුතු, සම්බන්ධීකරණ කටයුතු සහ පරිපාලන කටයුතු කිරීමට අමතරව පශ්චාද් උපාධි ශිෂ්‍යයන් සඳහා උපදේශකත්වය සැපයීම සඳහා ගත කිරීමට සිදු වෙයි.

**කළමනාකරණ හා පරිපාලන ප්‍රගතිය**

(අ) 2013-2017 කාලපරිච්ඡේදය සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඒකාබද්ධ සැලසුම (Corporate Plan) සැකසීම.

(ආ) 2013-2017 කාලපරිච්ඡේදය සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ක්‍රමෝපාය සැලසුම (Strategic Plan) සැකසීම.

(ඇ) 2013-2017 කාලපරිච්ඡේදය සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රධාන සැලැස්ම (Master Plan) සැකසීම.

(ඈ)යෝජිත පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ගොඩනැගිල්ල සඳහා සැලසුම් ඇඳීම සහ ඇස්තමේන්තු සැකසීම සිදු කෙරිණි. අංග සම්පූර්ණ යෝජනාවලිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යවන ලදී.

(ඉ) 2010 සහ 2011 වර්ෂයන්හි වාර්ෂික වාර්තා සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම සිදුවිය.

(ඊ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා Visiting Cards සැලසුම් කිරීම සහ මුද්‍රණය කිරීම සිදුවිය.

(උ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා විභාග ලේඛන (පිළිතුරු පත්‍ර) ආකෘතියක් සකසා මුද්‍රණය කරන ලදී.

(ඌ) උපකරණ හා උපාංග (ඡායා පිටපත් යන්ත්‍ර සහ පරිගණක උපාංග ආදී) මිල දී ගන්නා ලදී.

**2011/2012 වර්ෂයේ ශිෂ්‍ය ක්‍රියාකාරීත්වය**

වගුව - 01

**2011/2012 අවසන් ඇගැයීම සම්බන්ධයෙන් ශිෂ්‍ය ක්‍රියාකාරිත්වය**

| | **ELM 1301** | **ELM 1201** | **ELM 1202** | **ELM 1203** | **ELM 1101** | **ELM 1102** | **ELM 1104** | **ELM 2101** | **ELM 2102** |
|---|---|---|---|---|---|---|---|---|---|
| විභාගයට පෙනී සිටි මුළු ගණන | 10 | 12 | 10 | 14 | 15 | 16 | 14 | 10 | 10 |
| සමත් වූ ගණන | 10 | 12 | 10 | 14 | 15 | 16 | 14 | 08 | 10 |
| අසමත් වූ ප්‍රතිශතය | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (0%) | 0 (20%) | 0 (0%) |

**පර්යේෂණ**

පශ්චාද් උපාධි පර්යේෂණවල නියැලෙන සිසුන් විසින් තමන්ගේ පර්යේෂණ ඉදිරිපත් කරනු ලබන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික පර්යේෂණ සැසිය (Research Symposium) 2012 මාර්තු මස පැවැත්විණි. එක් ශිෂ්‍යාවක් කැනඩාවේ සිට ඇගේ පර්යේෂණ ඉදිරිපත් කිරීම නූතන තාක්ෂණය ඔස්සේ ඉදිරිපත් කළාය. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ඉංග්‍රීසි සාහිත්‍යය උගන්වන ශ්‍රී ලාංකික පාසල්වල ගුරුවරුන්ගේ අවශ්‍යතා පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයේ ප්‍රතිඵල මත, විචාරාත්මක සාහිත්‍ය අධ්‍යයනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව මෙහෙයවිණි. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ විෂය මාලාව සංවර්ධනය කිරීම සඳහා භාවිත කරන ලදී.

සලකා බලන වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම හා ඉගෙනීමේ ශ්‍රී ලාංකේය ගැටලු පිළිබඳ පර්යේෂණ සිය අධ්‍යයන ක්ෂේත්‍රයට එකතු කර ගන්නා ලදී. පර්යේෂණ පවත්වන ලද විෂය ක්ෂේත්‍රයන් බොහෝ අවස්ථාවල දී මීට ප්‍රථම අනාවරණය නොවී ඇති අතර බාහිර විභාග පරීක්ෂකවරු විශේෂයෙන් පර්යේෂණයේ ගුණාත්මකබව සහ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳව එහි ඇති ප්‍රායෝගික විශේෂත්වය පිළිබඳව මෙහිලා සඳහන් කොට ඇත. මෙම පර්යේෂණ එළිදැක්වීමට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය උත්සුක වෙයි.

**නව වැඩ සටහන් හා පාඨමාලා**

දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ශිෂ්‍යයන්හට ලබා දීම සඳහා යෝජනාවලියක් සැකසීම සිදු කෙරිණි.

විචාරාත්මක සාහිත්‍ය අධ්‍යයනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව සඳහා විෂය නිර්දේශය, පාඨමාලා අන්තර්ගතය සැකසීම හා ඉගෙනුම් ආධාරක සැකසීම සිදු කෙරිණි.

පර්යේෂණ ක්‍රම (Reserach Methods) සහ පර්යේෂණ සන්නිවේදනය (Reserach Communication) යන විෂයන්හි විෂය මාලාව සංශෝධනය හා යාවත්කාලීන කිරීම සහ ඉගෙනුම් ආධාරක සැකසීම ආරම්භ කෙරිණ.

**කාර්ය මණ්ඩලය**

2012 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රධාන තනතුරු සඳහා ස්ථිර කාර්ය මණ්ඩලය පත් කිරීම සිදුවිය. ඒ අනුව ස්ථිර අධ්‍යක්ෂවරියක පත් කිරීම 2012 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදුවිය. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුර සහ සහකාර මූල්‍යාධිකාරී තනතුර පිළිවෙළින් 2012 අප්‍රේල් මස 16 දින සහ 2012 අප්‍රේල් මස 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම සිදුවිය. මෙම තනතුරු තුන පිරවීමට ප්‍රථම මෙම තනතුරුවලට අදාළ කටයුතු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය විසින් අර්ධ කාලීන වැඩ බැලීමේ පදනම මත සිදු කෙරිණ.

2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රශ්න සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා පත් කරන ලද විශේෂ කමිටුවේ වාර්තාවේ විශේෂ කොට දක්වන ලද එක් කරුණක් වන්නේ කාර්ය මණ්ඩලයේ හිඟයයි. 2012 වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා අමතර තනතුරු දෙකක් (02) (එක් පරිගණක යෙදවුම් සහකාර තනතුරක්, එක් පොත් තබන්නා තනතුරක්) අනුමත විය. ඒ අනුව නව තනතුරු සඳහා පුද්ගලයන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. පොත් තබන්නා තනතුර සඳහා විශ්වවිද්‍යාල පද්ධතියෙන් (අභ්‍යන්තර) අයදුම්පත් කැඳවන ලද අතර කිසිදු සුදුසු අයදුම්කරුවෙකු නොසිටි හෙයින් මෙම තනතුරු සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීම මඟින් නැවත (විවෘත) අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව අයදුම්පත් 204 ක් ලැබුණු අතර අයදුම්කරුවෝ 161 ක් ලිඛිත විභාගයට පෙනී සිටියහ. කෙසේ වුව ද අනුගමනය කළ යුතු බඳවා ගැනීමේ ක්‍රමවේදය හේතුවෙන් පොත් තබන්නා තනතුර 2012 වර්ෂය ඇතුළත දී පිරවීමට නොහැකි විය.

පරිගණක යෙදවුම් සහකාර තනතුර පිරවීම සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට උසස් අධ්‍යාපන අමාත්‍යංශයෙන් ලැයිස්තු දෙකක් ලබා ගැනීමට සිදුවිය. බඳවා ගැනීමේ ක්‍රමවේදය දීර්ඝ වීම හේතුවෙන් 2012 වර්ෂය ඇතුළත දී පත්වීම් ලබා දීම සිදු කළ නොහැකි විය.

අධ්‍යයන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් පුරප්පාඩු තනතුරු දෙකක් විය. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සඳහා තෝරා පත්කර ගන්නා ලද අයදුම්කරුගේ නම 2011 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවන ලදී. 2012 මාර්තු මාසයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දන්වන ලද පරිදි අදාළ අයදුම්කරු අදාළ බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා නොමැති බව දන්වනු ලැබ තිබුණි. ඒ අනුව කළමනාකරණ මණ්ඩල තීරණය අනුව නැවත පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව 2012 මැයි මස දී පුවත්පත් දැන්වීම පළ විය. කෙසේ වුව ද ලැබුණු අයදුම්පත් කිසිවක් සුදුසුකම් සහිත අයගෙන් සමන්විත නොවූ

හෙයින් මෙම තනතුර සඳහා 2012 ජූලි මස දී නැවත අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ 2012 නොවැම්බර් මස දී පවත්වන ලද අතර 2012 දෙසැම්බර් මස දී මෙම තනතුරු දෙක පිරවීම සඳහා පාලක සභා අනුමැතිය ලැබුණි.

### අධ්‍යයනකරුවන් සඳහා සැපයෙන උපකාර

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාලය දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ පශ්චාද් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සිසුන් සඳහා පුස්තකාල පහසුකම් අඛණ්ඩව සැපයීම සිදු කරන ලද අතර පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සතු පොත්පත් හා ඉගෙනුම් සම්පත් තැම්පත් කිරීමේ කෝෂ්ඨාගාරය ලෙස ද ක්‍රියාත්මක විය. එසේම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාලයාධිපතිනිය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ අධ්‍යයන මණ්ඩලයේ (Board of Study) සාමජිකාවක ලෙස කටයුතු කළාය.

### අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ අධ්‍යයන ක්‍රියාකාරකම්

**ආචාර්ය එච්. වී. එම්. රත්වත්ත මිය, අධ්‍යක්ෂ**

Asia TEFL විධායක කමිටු සාමාජික

සාමාජික - සංස්කාරක උපදේශන මණ්ඩලය, ආසියානු TEFL සඟරාව, සියොල් කොරියාව

Asia TEFL ශ්‍රී ලාංකේය නියෝජනය

අධ්‍යයන විශ්ලේෂක - ආසියානු TEFL සඟරාව, සියොල් කොරියාව (සඟරාවේ බහු භාෂීය කටයුතු)

ප්‍රධාන සංස්කාරක - විස්ටාස් (Vistas) සඟරාව, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

සාමාජික - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ තත්ත්ව පරීක්ෂණ කමිටුව (Quality Assurance Committee)

සම්පත් දායක - (හිටපු සභාපති) SLELTA (ශ්‍රී ලංකා ඉංග්‍රීසි භාෂා ආචාර්යවරුන්ගේ සංගමය)

අධ්‍යයන සම්පත් විශ්ලේෂක - බහුභාෂීය ගුරුවරුන් සඳහා අධ්‍යයන සම්පත්, ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකාව

ඇගයුම්කරු - ද්විභාෂක ගුරුවරුන් සඳහා ඉගෙනුම් සම්පත්, ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකාව

සම්පත් දායක - 2012 වර්ෂයේ ද්විභාෂක අධ්‍යාපන සංවර්ධන සංකල්පීය වැඩසටහන්

සම්පත් දායක - ද්විභාෂක අධ්‍යාපන සම්බන්ධ ක්‍රමෝපාය සැකසීම, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකාව

සම්පත් දායක - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ ලේඛන කුසලතා වැඩමුළුව

පර්යේෂණ සම්පත් විශ්ලේෂක - අධ්‍යාපන පීඨය/කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

අත්පිටපත් විශ්ලේෂක - පාකිස්ථාන Lahore College on English Studies , පාකිස්ථානය

සාමාජික - අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පද්ධතියේ සහ ජාතික විභාග පද්ධතියේ ඉංග්‍රීසි කථනය පිළිබඳ ඒකාබද්ධ උපදේශන කමිටුව

**ආචාර්ය එච්.එස්. රඹුක්වැල්ල මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

ආරාධිත දේශක - “Sri Lankan Writing in English” සමුළුව, ගව්හාති විශ්වවිද්‍යාලය, ගව්හාති, ඇසෑම්, ඉන්දියාව

අත්පිටපත් විශ්ලේෂක - විස්ටාස් (Vistas) සඟරාව, මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨයේ ප්‍රකාශනයකි, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

පිටපත් සංස්කාරක - විස්ටාස් (Vistas) සඟරාව, මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨයේ ප්‍රකාශනයකි, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

විනිශ්චය මණ්ඩල සාමාජික - අවසන් වටයේ (ඉංග්‍රීසි නවකතා), 2012 රාජ්‍ය සාහිත්‍ය උත්සවය

විනිශ්චය මණ්ඩල සාමාජික - “Gration Prize for Sri Lankan Writing in English” - 2012 වර්ෂය

භාරකාර මණ්ඩල සාමාජික - “Gration Prize” කළමනාකරණ භාරය

අත්පිටපත් විශ්ලේෂක - “Sri Lankan Journal of Humanities” සඟරාව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

සම අධ්‍යාපන අධ්‍යක්ෂ - ලියාදිංචි පුණ්‍ය සංවිධානයක් වන “A Candle Aid Sri Lanka” මඟින් සංවිධානය කළ ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා වැඩසටහන

ප්‍රකාශන අත්පිටපත් විශ්ලේෂක - ජාතික අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය

බාහිර පර්යේෂක - ඉංග්‍රීසි අධ්‍යයනාංශය, ගව්හාති විශ්වවිද්‍යාලය, ඇසෑම්, ඉන්දියාව

සංස්කාරක - හොංකොං ඉංග්‍රීසි සාහිත්‍ය තොරතුරු ආයතනය, ඉංග්‍රීසි ඇකඩමිය, හොංකොං විශ්වවිද්‍යාලය

ගෞරව සහාය මහාචාර්ය - ඉංග්‍රීසි ඇකඩමිය (ගරු සේවය), හොංකොං විශ්වවිද්‍යාලය

**සහයෝගය සහ සංයෝගය**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් මෙහෙයවන ලද වැඩසටහන් සඳහා ආයතනය මඟින් අධ්‍යයන සහාය සැපයිණි.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ භාෂා අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සියලු ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සහයෝගය අඛණ්ඩව සපයන ලදී. පශ්චාද් උපාධි මට්ටමේ පර්යේෂණ සඳහා උපදේශකත්වය මෙම සහයෝගය නොලැබෙන්නට අසීරු කාර්යයක් වනු ඇත. එසේ වන්නේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සතුව අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුම සහිත අවශ්‍ය කාර්ය මණ්ඩලයක් නොමැති බැවිනි.

2012 වර්ෂය තුළ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ බොහෝ දෙනෙකුගේ සහයෝගය ලැබුණි. උපකුලපතිතුමා, ලේඛකාධිකාරීතුමා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ සහ අධ්‍යාපන පීඨයේ පීඨාධිපතිවරු, මූල්‍යාධිකාරීතුමා, පුස්තකාලයාධිපතිනිය සහ පුස්තකාලයේ කාර්ය මණ්ඩලය, පීඨ හතරෙහිම සහකාර ලේඛකාධිකාරීවරු, අධ්‍යාපන තාක්ෂණ අංශයේ සහ උපකුලපති කාර්යාලයේ කාර්ය මණ්ඩලය මේ අතර වෙති. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටී. තනරාජ් මහත්මා විසින් වාර්ෂික වාර්තා සහ කෝප් (COPE) කමිටුව සඳහා අවශ්‍ය වූ අනෙකුත් වාර්තා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම සිදු කර දෙන ලදී.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සේවාර්ජිත මහාචාර්ය නාලිනී රත්නසිරි මහත්මිය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ 2013-2014 ඒකාබද්ධ සැලසුම (Corporate Plan) සැකසීම සඳහා දායකත්වය සැපයුවාය.

ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ එක් එක් විෂය ඒකක සඳහා සහයෝගය ලබා දීම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ සේවාර්ජිත මහාචාර්ය ආර්. රහීම් මෙණෙවිය, බී. කේ. පී අබේසූරිය මිය, ආචාර්ය රධිකා ද සිල්වා මිය, ආචාර්ය වී. වී. මැදවත්තේගෙදර මිය, ආචාර්ය දිනලි දේවේන්ද්‍ර මිය යන අය විසින් ලබා දෙන ලදී. එසේම පළමු කාර්තුව තුළ වැඩ බලන අධ්‍යක්ෂ තනතුර භාෂා අධ්‍යයනාංශයේ ආචාර්ය එච්. වී. එම්. රත්වත්ත මහත්මිය විසින් දරන ලදී.

ඉගැන්වීමේ සහ ඇගයීමේ කාර්යයන්හි දී ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි අංශයේ හිටපු අධ්‍යක්ෂ එල්. කේ. කුමාරණතුංග මහත්මිය, යාපනය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එම්. කේ. එස්. අයියර්

මහතා, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එල්. ඩී. අයි. විජේතුංග මහතා, දිනලි ප්‍රනාන්දු මහත්මිය, ගම්පහ වික්‍රමාරච්චි ආයතනයේ කථිකාචාර්ය පාලිත දිසානායක මහතා, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටී. තනරාජ් මහතා යන අය විසින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ බාහිර කථිකාචාර්යවරුන් ලෙස සහයෝගය ලබා දෙන ලදී. මෙම වර්ෂයේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පශ්චාද් උපාධිය සම්පූර්ණ කරන ලද සිසුන් වන එම්.අයි ජැන්ස් මහත්මිය (සෞඛ්‍ය විද්‍යා ජාත්‍යන්තර ආයතනය) සහ එස්. ඉලංගකෝන් මහත්මිය (කොළඹ විශ්වවිද්‍යාලය) යන අය විසින් ද ඉගැන්වීමේ සහ ඇගයීමේ කාර්යයන් සඳහා සිය සහයෝගය ලබා දෙන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ සේවාර්ජිත මහාචාර්ය සිරෝමි ප්‍රනාන්දු මහත්මිය, ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි පිළිබඳ හිටපු අධ්‍යක්ෂ විජිතා යටවත්ත මහත්මිය, කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පීඨාධිපතිනි මහාචාර්ය මාරි පෙරේරා මෙණෙවිය, කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ අංශ ප්‍රධාන ආචාර්ය සී. ඩී. එස්. වැත්තෑව මිය, යාපනය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එම්. කේ. එස්. අයියර් මහතා, කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු මහත්මිය යන අය පශ්චාද් උපාධි නිබන්ධන බාහිර විභාග පරීක්ෂකවරු ලෙස සිය දායකත්වය සැපයූහ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සේවාර්ජිත මහාචාර්ය සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සමාරම්භක අධ්‍යක්ෂ මහාචාර්ය ආර්. රහීම් මෙණෙවිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ ආචාර්ය වී. වී. මැදවත්තේගෙදර, ආචාර්ය දිනලි දේවේන්ද්‍ර, ආචාර්ය රධිකා ද සිල්වා මහත්මීන් විසින් අභ්‍යන්තර නිබන්ධන පරීක්ෂකවරු ලෙස ද කටයුතු කරමින් සහයෝගය ලබා දෙන ලදී.

**බාහිර විද්වතුන්ගේ සේවය**

කැනඩාවේ ටොරොන්ටෝ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන අධ්‍යයන ඔන්ටාරියෝ ආයතනයේ ආචාර්ය උපාධි අපේක්ෂිකාවක වන ශ්‍රීමාලි හේරත් මිය බාහිර විද්වතෙකු ලෙස (ගරු සේවය) 2012 නොවැම්බර් සිට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කටයුතු කළාය. ඇයගේ ආචාර්ය උපාධි පර්යේෂණය ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුනක ක්‍රියාත්මක කරන ලද පූර්ව සේවා ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් පිළිබඳ අධ්‍යයනයකි. ඇය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කටයුතු කරන කල විෂය නිර්දේශ සහ ඉගෙනුම් ආධාරක සැලසුම් කිරීම (Curriculum and Materials Design) විෂය ඒකකයේ විෂය මාලාව සහ ඉගෙනුම් ආධාරක යාවත්කාලීන කිරීම ද එම විෂයට අදාළ ඉගැන්වීම් ද සිදු කළාය. තව ද ඇය පර්යේෂණ ක්‍රම හා සැලසුම් කිරීම (Reasearch Methods and

Design) විෂය ඒකකයේ පාඨමාලා කණ්ඩායම් සාමාජිකාවක ලෙස ද කටයුතු කළාය. එසේම ඇය මෙම පාඨමාලාව සඳහා ව්‍යවහාරික වාග්විද්‍යා මෑත කාලීන පර්යේෂණ ක්‍රම සහ ප්‍රායෝගික භාවිතය ද හඳුන්වා දුන්නාය. එසේම පර්යේෂණ සැසිය සඳහා පර්යේෂණ යෝජනා සහ ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් පර්යේෂණයන්හි නිරත සිසුන්ට උපදේශකත්වය සැපයීම ද ඇය විසින් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්හට පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත ලබා දෙන ලද සහයෝගය සම්බන්ධයෙන් කෘතවේදීත්වය ගෞරවයෙන් යුතුව පිරිනැමේ. මෙම සහයෝගය නොලැබෙන්නට මෙම ආයතනය ක්‍රියාත්මක මට්ටමින් නොපවතිනු ඇත.

මෙම සහයෝගය මඟින් තහවුරු වන්නේ පශ්චාද් උපාධි මට්ටමේ අධ්‍යයනයන්හි දී ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කරනු ලබන බවයි.

## 6. සංශෝධිත මූල්‍ය ප්‍රකාශය (නව ආකෘතිය අනුව)

### (අ) පුනරාවර්තන වියදම් පිළිබඳ තොරතුරු

| විෂය | 2011 වර්ෂයේ රුපියල් | 2012 වර්ෂයේ රුපියල් |
|---|---|---|
| (අ) පුද්ගල වැටුප් හා වේතන | 2,070,596.24 | 4,668,633.49 |
| (ආ) ගමන් වියදම් | 41,511.00 | 35,257.60 |
| (ඇ) සැපයුම් | 369,530.57 | 474,141.08 |
| (ඈ) නඩත්තු | 116,194.40 | 25,984.00 |
| (ඉ) කොන්ත්‍රාත් සේවා | 535,419.90 | 774,585.88 |
| (ඊ) වෙනත් | 657,143.63 | 1,009,393.59 |
| එකතුව | 3,790,395.74 | 6,987,995.64 |

### (ආ) ප්‍රාග්ධන වියදම් පිළිබඳ තොරතුරු

| විෂය | 2011 වර්ෂයේ රුපියල් | 2012 වර්ෂයේ රුපියල් |
|---|---|---|
| (අ) ගෘහ උපකරණ හා කාර්යාලයීය උපකරණ අත්පත් කර ගැනීම. | 140,292.60 | 1,051,982.00 |
| (ආ) යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම | - | - |
| (ඇ) ගොඩනැගිලි හා සැලසුම් අත්පත් කර ගැනීම | - | - |
| (ඈ) වෙනත් | 828,016.75 | 272,415.09 |
| එකතුව | 968,309.35 | 1,324,397.00 |

### (ඇ) මූල්‍ය ප්‍රගතිය (වියදම්) පිළිබඳ තොරතුරු

| විෂය | 2012 වර්ෂයේ ප්‍රතිපාදන රු. | 2012 වර්ෂයේ වියදම රු. | ඉතිරිය/හිඟය රු. |
|---|---|---|---|
| (අ) ව්‍යාපෘති හැර පුනරාවර්තන | 10,442,000.00 | 6,987,995.64 | 3,454,004.36 |
| (ආ) ව්‍යාපෘති හැර ප්‍රාග්ධන | 500,000.00 | 1,324,397.09 | 824,397.09 |
| (ඇ) ව්‍යාපෘති - දේශීය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක | - | - | - |
| (ඈ) ව්‍යාපෘති - විදේශීය ආධාර මත | - | - | - |
| එකතුව | 10,942,000.00 | 8,312,392.73 | 2,629,607.27 |

### (ඈ) මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (උපයන ලද ආදායම්)

| ආදායම් ප්‍රභවය | 2012 වර්ෂයේ ප්‍රතිපාදන රු. | 2012 වර්ෂයේ එකතුව රු. | අතිරික්තය/හිඟය |
|---|---|---|---|
| (අ) ප්‍රථම උපාධි අධ්‍යයන | - | - | - |
| (ආ) පශ්චාද් උපාධි අධ්‍යයන | 1,077,000.00 | 2,127,140.00 | 1,050,140.00 |
| (ඇ) උපදේශක සේවා | - | - | - |
| (ඈ) වෙනත් | 365,000.00 | 965,179.66 | 600,179.66 |
| එකතුව | 1,442,000.00 | 3,092,319.66 | 1,650,319.00 |

### (ඉ) මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය - 2012

| විෂය | විග්‍රහය | ඒක ශිෂ්‍ය පිරිවැය රු. |
|---|---|---|
| (අ) ඒක ශිෂ්‍ය පුනරාවර්තන පිරිවැය | පුනරාවර්තන වියදම්/ශිෂ්‍ය සංඛ්‍යාව | 84,192.71 |
| (ආ) ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන පිරිවැය | ප්‍රාග්ධන වියදම්/ශිෂ්‍ය සංඛ්‍යාව | 15,956.59 |
| එකතුව | | 100,149.30 |

## 7 . විගණන කමිටු වාර්තාව

### අභ්‍යන්තර විගණන වාර්තාව

අභ්‍යන්තර විගණන අංශය විසින් සලකා බලන ලද වර්ෂයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සලකා බැලිය යුතු අංශයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව විගණනය සිදු කරන ලදී. පහත සඳහන් අංශයන්ට අදාළව මේ පිළිබඳ කරුණු පෙළ ගැසීම සිදු කෙරේ.

1. පූර්ව විගණන
    - විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම
    - පාරිතෝෂික ගෙවීම්
    - විශ්‍රාම අරමුදලේ මුදල් නිදහස් කිරීම
    - කොන්ත්‍රාත් මත අවසන් ගෙවීම් සහ රැඳවුම් මුදල් නිදහස් කිරීම

2. සත්‍යාපනය
    - වාර්ෂික තොග සමීක්ෂණය - ප්‍රධාන ගබඩාව 2012.12.31 දිනට

3. අනාවරණය කරන ලද විගණන විමසුම් මඟින් සොයා බලන ලද කරුණු 2011 මූල්‍ය ගිණුම් සහ ක්‍රියාකාරීත්වය පදනම්ව විගණනය

4. විගණන කමිටුව

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් බැගින් රැස්වන අතර එමඟින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යාවලිය විමර්ෂණය කෙරේ.

කමිටුව විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ අභ්‍යන්තර විගණන අංශයෙන් මතු කරන ලද විගණන වාර්තා හා විමසුම් සහ ඒවාට අදාළව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මඟින් සපයනු ලැබ ඇති පිළිතුරු සලකා බලයි. එසේම කමිටුව නිර්දේශයන් ඉදිරිපත් කිරීම ද නිවැරදි ක්‍රියාමාර්ගයන් පිළිබඳ උපදෙස් ලබා දීම ද අධීක්ෂණය කිරීම ද සිදු කරයි.

සලකා බලන වර්ෂය තුළ විගණන කමිටුව අවස්ථා හතක (07) දී රැස් වී ඇත.

5. කාර්ය මණ්ඩලය

අභ්‍යන්තර විගණන අංශය පහත සඳහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විත වෙයි.

- සහකාර අභ්‍යන්තර විගණක
- විගණක සහකාර
- ලිපිකරුවෙක්
- පරිගණක යෙදවුම් සහකාර
- තාවකාලික කම්කරුවෙක්

8. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

PGIE
POST GRADUATE
INSTITUTE OF
ENGLISH

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## මූල්‍ය වාර්තාව

## 2012

# පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## 2012.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| වත්කම් | සටහන | | 2012 රු. | ප්‍රතිප්‍රකාශය 2011 රු. |
|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල පිරියත හා උපකරණ | 1 | | 3,146,412.94 | 2,526,860.26 |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | | 118,164.99 | | 94,960.23 |
| කෙටි කාලීන ආයෝජන | 2 | 8,027,257.55 | | 5,826,360.32 |
| විවිධ ණයගැතියෝ | 3 | 119,080.52 | | 71,276.40 |
| ශිෂ්‍යයන්ගෙන් ලැබීම් | 4 | 289,977.00 | | 135,250.00 |
| සේවක ණය හා අත්තිකාරම් | 5 | 380,965.00 | | 173,915.00 |
| බැංකුවේ ඇති මුදල් | 6 | 738,530.09 | | 1,179,231.60 |
| | | | 9,673,975.15 | 7,480,993.55 |
| **මුළු වත්කම්** | | | **12,820,388.09** | **10,007,853.81** |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| විවිධ ණයහිමියෝ | 7 | 15,792.00 | | 16,776.65 |
| ශිෂ්‍ය ගාස්තු කලින් ලැබීම් | 8 | 1,565,526.00 | | 969,896.00 |
| විවෘත විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු ශේෂය | | 8,195.14 | | 33,117.14 |
| උපචිත වියදම් | 9 | 661,401.39 | | 477,059.04 |
| | | | 2,250,914.53 | 1,496,848.83 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 10 | | 428,810.00 | 256,600.50 |
| **මුළු වගකීම්** | | | **2,679,724.53** | **1,753,449.33** |
| **ශුද්ධ වත්කම්** | | | **10,140,663.56** | **8,254,404.48** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | | |
| වැය කළ මූලධන ප්‍රතිපාදන | 11 | | 2,566,252.94 | 2,526,860.26 |
| වැය නොකළ මූලධන ප්‍රතිපාදන | 12 | | 77,504.93 | 321,742.02 |
| **සංචිත** | | | | |
| ප.උ.ඉ.භා ආයතනයේ පොදු සංචිතය | | | 3,537,620.26 | 1,446,516.77 |
| **විශේෂ අරමුදල්** | | | | |
| ප.උ.ඉ.භා. ආයතන සංවර්ධන අරමුදල | | | 3,959,285.43 | 3,959,285.43 |
| **මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | **10,140,663.56** | **8,254,404.48** |

| | | |
|---|---|---|
| අචාර්ය. එච්.වී.එම්. රත්වත්ත<br>අධ්‍යක්ෂ | එල්.එම්.සී. සිරිවර්ධන මයා<br>ජ්‍යෙ. සහකාර ලේඛකාධිකාරී | කේ.ජේ.එම්. නන්දන<br>සහකාර මූල්‍යාධිකාරී |

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
## 2012.12.31 දිනත් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශය

| | | | ප්‍රතිප්‍රකාශය |
|---|---|---|---|
| | | **2012** | **2011** |
| | | රු. | රු. |
| **ආදායම** | සටහන | | |
| රජයේ ආධාර - පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන | | 6,590,000.00 | 3,187,000.00 |
| රජයේ ආධාර - පුනරුත්තාපන පුනරාවර්තන | | - | 60,656.53 |
| පුනරුත්තාපන වියදම් සඳහා දායක මුදල | | - | 47,800.17 |
| අයදුම්පත් විකුණුම් ආදායම් | | 128,000.00 | 97,000.00 |
| ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු | | 46,583.00 | 11,015.00 |
| අධ්‍යයන ගාස්තු | | 1,323,158.00 | 729,650.00 |
| විභාග ගාස්තු | | 48,000.00 | 36,000.00 |
| පරිපූරක ගාස්තු | | 19,743.00 | 3,990.00 |
| නිබන්ධන ගාස්තු | | 164,503.00 | 109,169.00 |
| කෙටිකාලීන පාඨමාලා අයදුම්පත් විකුණුම් ආදායම් | | 5,000.00 | - |
| කෙටිකාලීන පාඨමාලා අධ්‍යයන ගාස්තු | | 196,800.00 | - |
| පොලී ආදායම් | **13** | 708,329.66 | 319,294.01 |
| විවිධ ලැබීම් | | 11,300.00 | 44,060.00 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | | 704,844.41 | 634,238.92 |
| **මුළු ආදායම** | | **9,946,261.07** | **5,279,873.63** |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | **14** | 4,668,633.49 | 2,070,596.24 |
| ගමන් වියදම් | **15** | 35,257.60 | 41,511.00 |
| සැපයුම් හා පාරිභෝගික වියදම් | **16** | 474,141.08 | 369,530.57 |
| නඩත්තු වියදම් | **17** | 25,984.00 | 116,194.40 |
| ගිවිසුම්ගත සේවා | **18** | 774,585.88 | 535,419.90 |
| වෙනත් පුනරාවර්තන වියදම් | **19** | 1,009,393.59 | 657,143.63 |
| වියදම් - පුනරුත්තාපන පුනරාවර්තන | | - | 108,456.70 |
| ස්ථාවර වත්කම් ක්ෂය වීම | | 704,844.41 | 634,238.92 |
| පාරිතෝෂික වියදම් | | 172,209.50 | (497,402.50) |
| **මුළු වියදම්** | | **7,865,049.55** | **4,035,688.86** |
| **කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ඌනතාව** | | **2,081,211.52** | **1,244,184.77** |

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ශුද්ධ වත්කම් ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

රු.

| | ප.උ.ඉ.භා ආයතනයේ පොදු සංචිතය | වෙනත් අරමුදල් | වැය කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | මුළු වටිනාකම |
|---|---|---|---|---|---|
| **31/12/2010 දිනට ශේෂය** | **571,142.00** | **4,007,085.43** | **2,192,790.26** | **100,708.00** | **6,871,725.69** |
| පූර්ව වර්ෂ ගැලපීම් | (368,810.00) | | | | |
| වර්ෂය තුළ වැයකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | (108,457.00) | - | 968,309.00 | (1,028,966.00) | (169,114.00) |
| වර්ෂය තුළ ලද/(වියදම්කළ) අරමුදල් | - | (47,800.00) | - | 1,250,000.00 | 1,202,200.00 |
| ප්‍රාග්ධන අරමුදල් ක්‍රමක්ෂය | - | - | (634,239.00) | - | (634,239.00) |
| පුනරුත්තාපන පුනරාවර්තන වියදම | 108,457.00 | | | | 108,457.00 |
| කාලච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාව) | 1,244,184.77 | | | | 1,244,184.77 |
| **31/12/2011 දිනට ශේෂය** | **1,446,516.77** | **3,959,285.43** | **2,526,860.26** | **321,742.00** | **8,623,214.46** |
| පූර්ව වර්ෂ ගැලපීම් | 9,891.97 | - | - | - | 9,891.97 |
| වර්ෂය තුළ වැයකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | - | - | 744,237.09 | (744,237.09) | - |
| වර්ෂය තුළ ලද/අරමුදල් | - | - | - | 500,000.00 | 500,000.00 |
| ප්‍රාග්ධන අරමුදල් ක්‍රමක්ෂය | - | - | (704,844.41) | - | (704,844.41) |
| කාලච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාව) | 2,081,211.52 | - | - | - | 2,081,211.52 |
| **31/12/2012 දිනට ශේෂය** | **3,537,620.26** | **3,959,285.43** | **2,566,252.94** | **77,504.91** | **10,140,663.54** |

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | 2012 (Rs.) | 2011 (Rs.) |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදනය කළ මුදල් ප්‍රවාහයන්** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය/(ඌනතාව) | | 2,081,211.52 | 1,244,184.77 |
| කෙටි කාලීන ආයෝජන වලින් ලද පොලී ආදායම | | (697,077.59) | (312,961.09) |
| <u>මුදල් නොවන ප්‍රවාහයන්</u> | | | |
| ස්ථාවර වත්කම් ක්ෂය | 704,844.41 | | 634,238.92 |
| පාරිතෝෂික | 172,209.50 | | (497,402.50) |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | (704,844.41) | | (634,238.92) |
| පූර්ව, වර්ෂයේ උපචිත පොලී ආදායම් ගැලපීම් | 17,604.43 | | - |
| පූර්ව වර්ෂ ගැලපීම් | 9,891.97 | 199,705.90 | (368,810.00) |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | | **1,583,839.83** | **65,011.18** |
| <u>කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම</u> | | | |
| තොගයේ අඩුවීම/(වැඩිවීම) | (23,204.76) | | 45,674.19 |
| උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම) | 755,050.35 | | 843,059.85 |
| උපචිත ආදායම් වැඩිවීම/(අඩුවීම) | (163,777.00) | | (135,250.00) |
| සේවක ණය හා අත්තිකාරම් වැඩිවීම/(අඩුවීම) | (207,050.00) | 361,018.59 | 58,169.00 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **1,944,858.42** | **876,664.22** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| දේපල පිරියත හා උපකරණ මිළදී ගැනීම | (1,036,190.00) | | (1,070,429.82) |
| පොත් හා වාර සඟරා මිළදී ගැනීම | (272,415.09) | | - |
| ඉදිකිරීම් කරුවන්ට ගෙවීම් | (16,776.65) | | 118,897.12 |
| විශේෂිත කාර්යන් සඳහා අරමුදල් හා ලැබීම් | - | | (47,800.17) |
| පුනරුත්තාපන පුනරාවර්තන වියදම් | - | | (60,656.53) |
| කෙටිකාලීන ආයෝජන වලින් ලද පොලී | 2,541.35 | | - |
| කෙටිකාලීන ආයෝජන ආපසු ගැනීම් | 937,280.46 | | - |
| කෙටිකාලීන ආයෝජන සඳහා යෙදවීම් | (2,500,000.00) | | (1,050,000.00) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(2,885,559.93)** | **(2,109,989.40)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන | 500,000.00 | | 1,250,000.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **500,000.00** | **1,250,000.00** |
| **මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **(440,701.51)** | **16,674.82** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දෑ** | | 1,179,231.60 | 1,162,556.78 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ** | | 738,530.09 | 1,179,231.60 |

## 2012 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1 වාර්තා කිරීමේ අස්ථිත්වය**

2005 අංක 04 දරන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලිය යටතේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය පිහිටුවා ඇත. 2006 ඔක්තෝම්බර් 01 දින සිට එහි මෙහෙයුම් ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී. වර්තමානයේ පශ්චාද් උපාධි පාඨමාලා හා කෙටිකාලීන පාඨමාලා පවත්වාගෙන යයි.

**2. අනුකූලතා ප්‍රකාශය.**

රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව උපචිත පදනම සහ ඓතිහාසික පිරිවැය පදනම මත පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍ය ප්‍රකාශ අනුකූලව පිළියෙල කර ඇත.

**3. රජයේ ප්‍රදානයන්**

ගිණුම් වර්ෂය තුළ රජයෙන් ලැබුණු මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. 7,090,000.00 වේ. මෙයින් රු. 6,590,000.00 ක් පුනරාවර්තන වියදම් ලෙස හඳුනාගෙන ඇති අතර එය ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස දක්වා ඇත. මූලධන වියදම් සඳහා ලද රජයේ ආධාර මුදල වැය නොවූ මූලධන ආධාර යටතේ ගිණුම් ගත කර ඇති අතර වැය කළ මුදල ප්‍රාග්ධන ගිණුමට මාරු කර ඇත. අදාළ තොරතුරු පහත පරිදි වේ.

| | 2012 වර්ෂයේ දී ලැබුණු මුදල (රු.) | වැය නොකළ මුදල (රු.) |
|---|---|---|
| පුනරාවර්තන ආධාර | 6,590,000.00 | - |
| ප්‍රාග්ධන ප්‍රධාන | | |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 250,000.00 | 76,342.67 |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 250,000.00 | 1,162.26 |
| **එකතුව** | 7,090,000.00 | 77,504.93 |

**මූලධන වියදම් ප්‍රතිපාදන ක්‍රමක්ෂය**

මූලධන වියදම් සඳහා ලද ප්‍රතිපාදන ප්‍රාග්ධනීකරණය කර අදාළ වත්කම්හි ඵලදායී ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ. මිලදීගත් වර්ෂයේ දී ක්‍රමක්ෂය නොකිරීම හා ඉවත්කරන වර්ෂයේ දී සම්පූර්ණ වර්ෂය සඳහා ක්‍රමක්ෂය කිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

4. **දේපල පිරියත හා උපකරණ**

(අ) 05.10.1995 දින දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 649 අනුව සරල මාර්ග ක්‍රමය යටතේ දේපල පිරියත හා කාර්යාල උපකරණ ක්ෂය කර ඇත. වත්කම මිලදීගත් වර්ෂයේ ක්ෂය නොකරන අතර වත්කම් ඉවත්කරන වර්ෂයේ මුළු වර්ෂයටම ක්ෂය ගණනය කිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

(ආ) පිළිගත් වාර්ෂික ක්ෂය ප්‍රතිපාදන ප්‍රතිශතයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| ❖ ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 10% |
| ❖ කාර්යාල උපකරණ | 20% |
| ❖ පරිගණක හා උපාංග | 20% |
| ❖ පුස්තකාල පොත් | 20% |

(ඇ) ස්ථාවර වත්කම්වල අපේක්ෂිත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගනනය කර ඇත.

(ඈ) ස්ථාවර වත්කම් සමුච්චිත ක්ෂය අඩුකළ පසු වටිනාකමට දක්වා ඇත.

(ඉ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍යන්ගේ ප්‍රයෝජනය සඳහා ආයතනය විසින් මිල දී ගත් පුස්තකාල පොත් හා වාර සඟරා විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පුස්තකාල වෙත යවා ඇත.

5. **කෙටිකාලීන ආයෝජන**

කෙටිකාලීන මුදල් අතිරික්තයන් මහජන බැංකුවේ "කෙටිකාලීන ස්ථාවර තැන්පතු" මත ආයෝජනය කර ඇත. ලද පොලිය ද සහිතව ආයෝජනයන්හි ශේෂය ගණනය කරඇත.

6. **තොග ගණනය**

පෙර ඇතුළු පෙර පිටවීම් ක්‍රමයට (FIFO) අනුව පිරිවැය මත අවසන් තොගය ගණනය කර ඇත

7. **වගකීම්**

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන අවස්තාවේ දී හඳුනාගත් සියලු වගකීම් ගිණුම් ගත කර ඇත.

8. **වෙන්කිරීම්**

වර්ෂ 01 ක අඛණ්ඩ සේවාකාලයක් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙනුවෙන් විශ්‍රාම පාරිතෝශික සඳහා වෙන් කිරීම් කර ඇත. නමුත් විශ්වවිද්‍යාල පද්දතිය තුළ වර්ෂ 05 ක අඛණ්ඩ සේවාකාලයක් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයන්හට පමණක් විශ්‍රාම ගැනීමේ දී විශ්‍රාම පාරිතෝශිකය ලැබීමට හිමිකම් ඇත්තේය.

9. **ආදායම හඳුනා ගැනීම**

රජයෙන් ලැබුණු ප්‍රදානයන් සහ අභ්‍යන්තර ඉපයීම් උපචිත පදනම මත ආදායම් ලෙස ගිණුම්ගතකර ඇත.

10. **වියදම් හඳුනා ගැනීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති වියදම් ශීර්ෂයන්ට අනුකූලව වියදම් වර්ගීකරණය හා විශ්ලේෂණය සිදුකර ඇත.

11. **බදු කරණය**

දේශීය ආදායම් පනතේ විධානයන්ට අනුව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ලැබෙන ලාභාංශ හා පොලී ආදායම් හැර අනෙකුත් ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

12. **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වක්‍ර ක්‍රමය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## මූල්‍ය තත්ව ප්‍රකාශනය සඳහා සටහන්

සටහන - 01

**දේපල පිරියත හා උපකරණ** රු.

| | ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | කාර්යාල උපකරණ | පුස්තකාල පොත් හා වාර සඟරා | පරිගණක හා උපාංග | එකතුව |
|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | |
| 01/01/2012 දිනට ශේෂය | 519,850.61 | 1,183,657.00 | 1,426,422.65 | 1,153,327.72 | 4,283,257.98 |
| (+) වර්ෂය තුල මිලදී ගැනීම් | 8,530.00 | 580,160.00 | 272,415.09 | 463,292.00 | 1,324,397.09 |
| ( -) වර්ෂය තුල බැහැරකිරීම් | - | - | - | - | - |
| 31/12/2012 දිනට ශේෂය | **528,380.61** | **1,763,817.00** | **1,698,837.74** | **1,616,619.72** | **5,607,655.07** |
| **ක්ෂය සඳහා වෙන් කිරීම්** | | | | | |
| 01/01/2012 දිනට ශේෂය | 122,463.00 | 552,843.20 | 561,724.90 | 519,366.62 | 1,756,397.72 |
| (+) වසර සඳහා ක්ෂය වෙන් කිරීම් | 51,985.06 | 236,731.40 | 185,462.41 | 230,665.54 | 704,844.41 |
| ( -) වර්ෂය තුල බැහැරකිරීම් | - | - | - | - | - |
| 31/12/2012 දිනට ශේෂය | **174,448.06** | **789,574.60** | **747,187.31** | **750,032.16** | **2,461,242.13** |
| 01/01/2012 දිනට ශුද්ධ පොත් අගය | 397,387.61 | 630,813.80 | 864,697.75 | 633,961.10 | 2,526,860.26 |
| 31/12/2012 දිනට ශුද්ධ පොත් අගය | **353,932.55** | **974,242.40** | **951,650.43** | **866,587.56** | **3,146,412.94** |

සටහන - 02

**කෙටි කාලීන ආයෝජන**

| | **2012** රු. | **2011** රු. |
|---|---|---|
| ආරම්භක ශේෂය | 5,826,360.32 | 4,496,832.82 |
| කෙටි කාලීන ආයෝජන මත පොලී නැවත ආයෝජනය කිරීම | 638,177.69 | 279,527.50 |
| වර්ෂය තුල නව කෙටි කාලීන ආයෝජන | 2,500,000.00 | 1,050,000.00 |
| වර්ෂය තුල කෙටි කාලීන ආයෝජන ආපසු ගැනීම් | (937,280.46) | - |
| | 8,027,257.55 | 5,826,360.32 |

සටහන - 03

| ණය ගැතියෝ සහ ලැබියයුතු දෑ | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| ලැබියයුතු පොලී | 110,080.52 | 71,326.40 |
| විවිධ ණය ගැතියෝ | 9,000.00 | (50.00) |
| | 119,080.52 | 71,276.40 |

සටහන - 04

| ශිෂ්‍යයන්ගෙන් ලැබියයුතු ගාස්තු | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| ලැබියයුතු අධ්‍යයන ගාස්තු | 261,559.00 | 132,650.00 |
| ලැබියයුතු නිබන්ධන ගාස්තු | 28,418.00 | - |
| ලැබියයුතු විභාග ගාස්තු | - | 2,600.00 |
| | 289,977.00 | 135,250.00 |

සටහන - 05

| සේවක ණය හා අත්තිකාරම් | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| ආපදා ණය | 368,505.00 | 163,505.00 |
| සේවක ණය | 1,360.00 | 3,060.00 |
| වාහන ණය | 4,100.00 | 5,100.00 |
| උත්සව අත්තිකාරම් | 4,500.00 | 2,000.00 |
| විශේෂ අත්තිකාරම් | 2,500.00 | 250.00 |
| | 380,965.00 | 173,915.00 |

සටහන - 06

| බැංකුවේ ඇති මුදල් | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| මහජන බැංකු ගිණුම් අංක 174100 156 838310 | 386,956.81 | 286,500.14 |
| මහජන බැංකු ගිණුම් අංක 174100 246 838311 | 275,053.00 | 323,451.19 |
| මහජන බැංකු ගිණුම් අංක 174100 336 838312 | 76,520.28 | 569,280.27 |
| | 738,530.09 | 1,179,231.60 |

සටහන - 07

| විවිධ ණයහිමියෝ | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| ලීනස් ඉලෙක්ට්‍රිකල්ස් | - | 16,776.65 |
| සොෆ්ට්ලොජික් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් | 15,792.00 | - |
| | 15,792.00 | 16,776.65 |

සටහන - 08

<u>ශිෂ්‍ය ගාස්තු කලින් ලැබීම්</u>

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| අධ්‍යයන ගාස්තු කලින් ලැබීම් | 1,310,501.00 | 725,350.00 |
| නිබන්ධන ගාස්තු කලින් ලැබීම් | 80,166.00 | 113,001.00 |
| විභාග ගාස්තු කලින් ලැබීම් | 50,600.00 | 98,200.00 |
| ලියාපදිංචි ගාස්තු කලින් ලැබීම් | 43,592.00 | 24,795.00 |
| පරිපූරක ගාස්තු කලින් ලැබීම් | 34,667.00 | 8,550.00 |
| කෙටිකාලීන පාඨමාලා අධ්‍යයන ගාස්තු කලින් ලැබීම් | 46,000.00 | - |
| | 1,565,526.00 | 969,896.00 |

සටහන - 09

<u>උපචිත වියදම්</u>

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| 2009 වර්ෂය සඳහා විගණන ගාස්තු | - | 131,040.00 |
| 2010 වර්ෂය සඳහා විගණන ගාස්තු | 129,360.00 | 144,144.00 |
| 2011 වර්ෂය සඳහා විගණන ගාස්තු | 142,296.00 | 158,558.40 |
| 2012 වර්ෂය සඳහා විගණන ගාස්තු | 156,525.60 | - |
| 2010 වර්ෂයේ ඇතුලත්වීමේ විභාගය සඳහා ගෙවීම් | - | 7,100.00 |
| 2011 වර්ෂයේ ඇතුලත්වීමේ විභාගය සඳහා ගෙවීම් | - | 8,300.00 |
| විදුලි සංදේශ වියදම් | 16,748.79 | 4,457.62 |
| අතිකාල දීමනා | 12,972.00 | 3,271.52 |
| වැඩ බැලීම් වෙනුවෙන් ගෙවීම් | - | 20,187.50 |
| විභාග ගාස්තු | 600.00 | - |
| බාහිර කථිකාචාර්ය හා විභාග ගාස්තු | 111,695.00 | - |
| සාමාජිකත්ව ගාස්තු | 9,575.00 | - |
| සංග්‍රහ වියදම් | 5,650.00 | - |
| ගමන් වියදම් | 2,640.00 | - |
| මුද්දර ගාස්තු හා PAYE | 1,675.00 | - |
| කෙටිකාලීන පාඨමාලා වියදම් | 6,000.00 | - |
| සංයුක්ත සැලැස්ම සැකසීම සඳහා වියදම් | 18,000.00 | - |
| කෙටිකාලීන පාඨමාලා වියදම් | 23,664.00 | |
| පාඨමාලා නිබන්ධන ලිවීම සහ සංස්කරණය සඳහා වියදම් | 24,000.00 | |
| | 661,401.39 | 477,059.04 |

සටහන - 10

| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| ආරම්භක ශේෂය | 256,600.50 | 754,003.00 |
| වර්ෂය තුල පාරිතෝෂික ගෙවීම් | - | - |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | 172,209.50 | (497,402.50) |
| | 428,810.00 | 256,600.50 |

සටහන - 11

| වැය කළ මූලධන ප්‍රතිපාදන | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| ආරම්භක ශේෂය | 2,526,860.26 | 2,192,790.26 |
| වත්කම් අත්කරගැනීම් | 744,237.09 | 968,309.00 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය | (704,844.41) | (634,239.00) |
| | 2,566,252.94 | 2,526,860.26 |

සටහන - 12

| වැය නොකළ මූලධන ප්‍රතිපාදන | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| ආරම්භක ශේෂය | 321,742.02 | 100,708.00 |
| රජයෙන් ලැබුණු ප්‍රතිපාදන | 500,000.00 | 1,250,000.00 |
| වත්කම් අත්කරගැනීම් | (744,237.09) | (1,028,965.98) |
| | 77,504.93 | 321,742.02 |

## පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
## මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශනය සඳහා සටහන්

සටහන - 13

| පොලී ආදායම | 2012 Rs. | 2011 Rs. |
|---|---|---|
| කෙටිකාලීන ආයෝජන වලින් ලද පොලී | 697,077.59 | 312,961.09 |
| සේවක ණය හා අත්තිකාරම් වලින් ලද පොලී | 11,252.07 | 6,332.92 |
| | 708,329.66 | 319,294.01 |

සටහන - 14

| පුද්ගල පඩිනඩි | 2012 Rs. | 2011 Rs. |
|---|---|---|
| අධ්‍යයන | | |
| **වැටුප් හා වේතන** | | |
| වැටුප් හා වේතන | 997,102.50 | 197,510.00 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 126,226.18 | 29,004.38 |
| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල | 42,644.20 | 6,960.00 |
| සේවක භාරකාර අරමුදල 3% | 33,774.07 | 7,192.88 |
| බාහිර කථිකාචාර්ය ගෙවීම් | 111,000.00 | 87,000.00 |
| | 1,310,746.95 | 327,667.26 |
| **වෙනත් දීමනා** | | |
| අධ්‍යයන දීමනා | 648,830.60 | 86,382.63 |
| පර්යේෂණ දීමනාව | 249,275.63 | 18,825.00 |
| ජීවන වියදම් දීමනා | 128,700.00 | 22,200.00 |
| විශේෂ දීමනාව | 128,089.37 | 9,875.50 |
| වැඩ බැලීමේ ගෙවීම් | 24,000.00 | 107,200.01 |
| | 1,178,895.60 | 244,483.14 |
| **පුද්ගල පඩිනඩි - අධ්‍යයන** | **2,489,642.55** | **572,150.40** |

අනධ්‍යයන

| | | |
|---|---|---|
| **වැටුප් හා වේතන** | | |
| වැටුප් හා වේතන | 1,291,924.65 | 847,200.32 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 151,051.55 | 106,138.36 |
| විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල | 91,119.00 | 44,634.19 |
| සේවක භාරකාර අරමුදල 3% | 48,434.12 | 30,154.50 |
| වැඩ බැලීමේ ගෙවීම් | 24,562.50 | 98,919.01 |
| | 1,607,091.82 | 1,127,046.38 |
| **වෙනත් දීමනා** | | |
| භාෂා දීමනාව | 2,940.00 | 7,326.29 |
| ජීවන වියදම් දීමනා | 330,525.00 | 251,859.68 |
| විශේෂ දීමනාව | 171,043.43 | 42,346.11 |
| | 504,508.43 | 301,532.08 |
| පුද්ගල පඩිනඩි - අනධ්‍යයන | **2,111,600.25** | **1,428,578.46** |
| අතිකාල දීමනා හා නිවාඩු දින ගෙවීම් | | |
| අතිකාල දීමනා | 67,390.69 | 69,867.38 |
| නිවාඩු දින ගෙවීම් | - | - |
| | **67,390.69** | **69,867.38** |
| පුද්ගල පඩිනඩි මුළු එකතුව | **4,668,633.49** | **2,070,596.24** |

සටහන - 15

| **ගමන් වියදම්** | **2012 Rs.** | **2011 Rs.** |
|---|---|---|
| දේශීය | 35,257.60 | 41,511.00 |
| විදේශීය | - | - |
| | **35,257.60** | **41,511.00** |

සටහන - 16

| **සැපයුම් හා පාරිභෝගික වියදම්** | **2012 Rs.** | **2011 Rs.** |
|---|---|---|
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 259,780.94 | 345,385.45 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 208,600.00 | - |
| වෙනත් | | |
| නිල ඇඳුම් | 5,760.14 | 3,752.89 |
| වෙනත් | - | 20,392.23 |
| | **474,141.08** | **369,530.57** |

සටහන - 17

| නඩත්තු වියදම් | 2012<br>Rs. | 2011<br>Rs. |
| --- | --- | --- |
| දේපල පිරියත හා උපකරණ | 25,984.00 | 116,194.40 |
| | **25,984.00** | **116,194.40** |

සටහන - 18

| ගිවිසුම්ගත සේවා | 2012<br>Rs. | 2011<br>Rs. |
| --- | --- | --- |
| තැපැල් ගාස්තු | 35,409.00 | 51,143.00 |
| විදුලි සංදේශ වියදම් | 131,192.20 | 55,869.86 |
| විදුලිය | 152,943.60 | 152,943.60 |
| ජලය | 27,056.40 | 27,056.40 |
| මුද්‍රණ හා ප්‍රචාරණ | 427,984.68 | 248,407.04 |
| | **774,585.88** | **535,419.90** |

සටහන - 19

| වෙනත් පුනරාවර්තන වියදම් | 2012<br>Rs. | 2011<br>Rs. |
| --- | --- | --- |
| විශේෂ සේවා - කළමණාකරන කමිටු වියදම් | 399,089.00 | 247,400.00 |
| විශේෂ සේවා - වෘත්තීය හා අනෙකුත් ගෙවීම් | 156,525.60 | 166,354.63 |
| වැඩමුළු සහ සම්මන්ත්‍රණ | - | 14,237.00 |
| අධ්‍යයන පර්යේෂණ හා පළකිරීම් | 800.00 | - |
| කාර්ය මණ්ඩල සංවර්ධනය (පරිපාලකයන් සඳහා පුහුණු කිරීම්) | 9,000.00 | - |
| සිසුන් සඳහා පාඨමාලා නිබන්ධන | 24,000.00 | - |
| සංයුක්ත සැලැස්ම සඳහා වියදම් | 18,000.00 | - |
| දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු | 7,080.00 | 4,500.00 |
| සංග්‍රහ වියදම් | 95,915.79 | 61,663.00 |
| බැංකු ගාස්තු | 7,601.40 | 8,088.92 |
| සාමාජිකත්ව හා දායකත්ව ගාස්තු | 9,575.00 | - |
| විභාග වියදම් | 103,635.00 | 79,890.00 |
| වෙනත් | 83,402.00 | 75,010.08 |
| | 914,623.79 | 657,143.63 |
| **කෙටිකාලීන පාඨමාලා වියදම්** | | |
| ලිපිද්‍රව්‍ය වියදම් | 11,544.00 | - |
| ප්‍රචාරණ | 59,561.80 | - |
| සමායෝජන සහ උපකාරක සේවා වියදම් | 23,664.00 | |
| | 94,769.80 | - |
| **වෙනත් ක්‍රියාකාරකම් වියදම්වල මුළු එකතුව** | **1,009,393.59** | **657,143.63** |

# 9. විගණකාධිපතිවරයාගේ වාර්තාව


විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல / My No ඊසී/එච්/පීජ්අයිඊ/එෆ්ජ්/12 ඔබේ අංකය / உமது இல / Your No. දිනය / திகதி / Date 2013 අගෝස්තු 05 දින

අධ්‍යක්ෂ,
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107 (5) සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1:2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை | No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone 2887028 -34 | ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223 | ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ மெயில் / E-mail. oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2005 අංක 4 දරන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතන ආඥා පනතේ 4(ඇ) සහ (ඉ) වගන්ති පරිදි සමාලෝචිත වර්ෂය තුළදී පවත්වන ලද කෙටිකාලීන පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර ආයතනයේ සමාලෝචිත වර්ෂයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය රු.4,508,788 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,942,815ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.6,590,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එකී ඌනතාවය රු.2,081,211 ක අතිරික්තයක් බවට පරිවර්තනය වූ අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා ලද රු.3,187,000 ක් රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ ඌනතාවය රු.1,244,185 ක අතිරික්තයක් බවට පරිවර්තනය වීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.837,026 කින් වැඩි වීමක් දැක්වුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

ආයතනය, සමාලෝචිත වර්ෂය තුළදී "Critical Literary Reading Skill" නමැති කෙටිකාලීන පාඨමාලාවක් පවත්වා තිබුණි. කෙසේ වෙතත්, පාඨමාලාව පිළිබඳ දැන්වීම් පළවීමෙන් පසු එය ආරම්භ කිරීම දෙවතාවක් කල්දමා තිබුණි. පාඨමාලාවේ ඇස්තමේන්තුගත ආදායම රු.540,000 වුවත් සමාලෝචිත වර්ෂයේදී එකතු කළ තථ්‍ය ආදායම රු.242,800 ක් පමණක් විය.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

ආයතනයේ 2009 - 2012 දක්වා කාලය සඳහා වූ සංයුක්ත සැලැස්ම කාලීන පදනමක් මත සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

(අ) 2012 ක්‍රියාකාරී සැලැස්ම, සංයුක්ත සැලැස්ම සමඟ අනුකූල නොවිය. ඉංග්‍රීසි මාධ්‍ය උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව, 2012 වර්ෂයේදී ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට උපලේඛන ගත කර තිබුණ නමුත් ආයතනය විසින්, එය 2014 වර්ෂය දක්වා ප්‍රමාද කර තිබුණි.

(ආ) අවසන් විභාගය, ඇගයීම හා ප්‍රතිඵල නිකුත් කිරීම වැනි කාර්යයන් නිශ්චිත කාලසීමාව තුළ සිදුකර නොතිබුණි.

(ඇ) පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීමේ ශාස්ත්‍රපති උපාධි ප්‍රදානය කිරීම සඳහා අධ්‍යයන මණ්ඩලය විසින් 2012 මාර්තු මාසයේදී කරන ලද යෝජනාව, අනුමත කර තිබුණු අතර මාස 09 කට පසුව 2012 දෙසැම්බර් 21 දින පාලක මණ්ඩලය විසින් ඒ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, 2013 මාර්තු වන විටත් පාඨමාලාව ආරම්භ කර ක්‍රියාත්මක කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන වැඩසටහනෙහි සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයේ කටයුතු වලින් 60% ක් පරීක්ෂා කරන බව සඳහන් වී තිබුණද, සමලෝචිත වර්ෂය සඳහා එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි.

5.4 අයවැය පාලනය

තථ්‍ය ආදායම, අයවැයගත ආදායමට වඩා සියයට 114 කින් ඉක්මවා තිබූ අතර තථ්‍ය පුනරාවර්තන වියදම්, අයවැයගත පුනරාවර්තන වියදමට වඩා සියයට 33 කින් අඩු වී තිබුණි. ඒ අනුව අයවැය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5.5 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

ආයතනයේ 2010 සහ 2011 වර්ෂවල වාර්ෂික වාර්තා 2013 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභා ගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) පාඨමාලා පවත්වාගෙන යාම සහ ප්‍රතිඵල නිකුත් කිරීම.

(ආ) කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.

(ඇ) අයවැය.

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.

5

## 10. විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු

Postgraduate Institute of English
The Open University of Sri Lanka
P.O. Box 21
Nawala
Nugegoda
Telephone: 011-2825805, 2825806, 2881027, 2881032, 2853777
Director: Ext. 528, SAR: Ext. 527 AB: Ext. 532

2014 පෙබරවාරි 17

එච්.ඒ.එස් සමරවීර මහතා,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි.

**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාද් උපාධි ආයතනයේ 2012 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 108 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ 2013 අගෝස්තු 05 දිනැති ලිපියට පිළිතුරු වශයෙනි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**1.3 විගණකගේ වගකීම**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය නොකළ මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 නීතී රීතී රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වන්නේ මාස දොළොහක්වත් පිළිවෙළින් අඛණ්ඩව අධ්‍යයන කටයුතු සිදු කෙරෙන සහ විශ්වවිද්‍යාල උපාධි ප්‍රදානෝත්සවයේ සහතික පත්‍ර ප්‍රදානය කෙරෙන උපකුලපතිවරයා විසින් සහතිකවල අත්සන් කරනු ලබන අධ්‍යයන පාඨමාලාවන් සම්බන්ධයෙනි. අනෙක් අතින් බලන කල කෙටි කාලීන පාඨමාලා සාමාන්‍යයෙන් සති දහයකට (10) වඩා කෙටි කාලීන පාඨමාලා වන අතර තනි පාඨමාලාවකට සීමා වෙයි. එසේම මෙබඳු කෙටි කාලීන පාඨමාලාවන් සපයනු ලබන්නේ උපාධිධාරී ගුරුවරුන් අතරින් අදාළ ක්ෂෙත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ සංවර්ධනයක අවශ්‍යතාවක් මතුවන පරිසරයකදී ය. ඒ අනුව කෙටි කාලීන පාඨමාලා නිතිපතා ක්‍රියාත්මක නොකෙරේ. අවශ්‍යතාව ඇති වූ විට පමණක් ක්‍රියාත්මක වේ. මේ අනුව මෙම පාඨමාලාවන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ

අධ්‍යයන මණ්ඩල (Board of Study) සහ කළමනාකරණ මණ්ඩල (Board of Management) අනුමැතිය සහිතව ක්‍රියාත්මක වේ.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ දී අතිරික්තය රු. 837,026.00 කින් වැඩි වී ඇත. මෙම මූල්‍ය ක්‍රියාකාරීත්වය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය කෙරෙහි ධනාත්මකව බලපානු ඇත.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

විචාරාත්මක සාහිත්‍ය අධ්‍යයනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව (Short Course on Critical Literary Reading Skills) 2012.06.19 සහ 2012.06.25 ලෙස දෙවරක් කල් දැමීමට සිදු විය. 2012.06.06 දින සිට ආරම්භ කරන ලද අතර මෙම කාලය තුළ පංතිකාමර පහසුකම් හා අනෙකුත් පහසුකම් ලබා ගත නොහැකි විය.

දෙවන වර මෙම පාඨමාලාව කල් දමන ලද්දේ 2012.07.04 දින සිට ආරම්භ වූ විශ්වවිද්‍යාල ආචාර්ය සමිති සම්මේලනයේ (FUTA) වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයන් හේතුවෙනි. මේ හේතුවෙන් පාඨමාලාවේ ඉගැන්වීම් කටයුතු කිරීම සඳහා ආචාර්යවරුන්ගේ සේවය ලබා ගත නොහැකි විය. ආචාර්ය සමිති සම්මේලනයේ වෘත්තීය ක්‍රියාමාර්ගයන් අවසන් වූ විගසම මෙම පාඨමාලාව ආරම්භ විය. තව ද මෙම පාඨමාලාව ආයතනයට කිසිදු මූල්‍යමයට පාඩුවක් සිදු කොට නැත.

**5. වගවීම සහ යහපාලනය**

**5.1 ඒකාබද්ධ සැලසුම**

2013-2017 කාලපරිච්ඡේදයට අදාළව ඒකාබද්ධ සැලසුම (Corporate Plan) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට අදාළව සකස් කරන ලද අතර 2012 වර්ෂයේ දී ඒකාබද්ධ සැලසුම සැකසීම හා සාකච්ඡා කිරීම සඳහා මූලික කමිටු රැස්වීම් තුනක් පවත්වන ලදී. අවශ්‍යතාවයන් යාවත්කාලීන කරන ලද ඒකාබද්ධ සැලසුම පරිසමාප්තියට පත් කරන ලදී. මෙහි 2012-2014 කාලපරිච්ඡේදයට අදාළව සැලසුම් කරන ලද සියලු කටයුතු මෙහි අන්තර්ගතය.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

(අ) 2011-2012 කාලයට අදාළව යාවත්කාලීන කරන ලද ඒකාබද්ධ සැලැසුමෙහි අන්තර්ගත ක්‍රියාකාරී සැලැස්මෙහි 2012 වර්ෂයේ දී ආරම්භ වීමට නියමිත ඉංග්‍රීසි මාධ්‍ය උපදේශනය පිළිබඳ පශ්චාද් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව අන්තර්ගත කොට නොතිබුණි. මෙය 2014 දක්වා කල්දමා ඇති අතර එය 2013-2017 කාලපරිච්ඡේදයට අදාළව සකසන ලද නව ඒකාබද්ධ සැලැසුමෙහි අන්තර්ගත කොට ඇත.

(ආ) අවසන් විභාග,ඇගයීම් සහ ප්‍රතිඵල නිකුත් කිරීම

2012 ජූනි - සැප්තැම්බර් කාලය ඇතුළත අවසන් ඇගයීම් සැලසුම් කර තිබුණි. විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයන් 2012.07.04 දින සිට

2012.10.10 දින දක්වා ක්‍රියාත්මක විය. ගුරුවරුන් සහ විභාග පරීක්ෂකවරුන් නොමැතිව විභාග ප්‍රශ්න පත්‍ර සැකසීම, ලකුණු දැමීම, විභාග පැවැත්වීම සහ ඇගයීම් කිරීම සිදු කළ නොහැකි විය. කෙසේ වෙතත් විභාග, ඇගයීම් සහ ඒහා සමගාමීව ප්‍රතිඵල නිකුත් කිරීම වෘත්තීය සමිති ක්‍රියාමාර්ග අවසන් වීමත් සමග සිදු විය.

(ඇ) දෙවන භාෂා පරිසරය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව පිළිබඳ යෝජනාවලිය 2013.03.06 දින අධ්‍යයන මණ්ඩලයෙන් (Board of Study) ද අනුමත වූ අතර 2012.06.29 දින සනාතන සභා (Senate) අනුමැතිය සඳහා යවන ලදී. කෙසේ වුව ද 2012 ජූනි මස සනාතන සභා රැස්වීම නොපවත්වන ලද අතර එතැන් සිට ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල ද සනාතන සභා රැස්වීම නොපවත්විණි. 2012 ඔක්තෝබර් මස සනාතන සභා රැස්වීමේ දී එම යෝජනා පත්‍රිකාව අනුමත වූ අතර 2012 දෙසැම්බර් මස පාලක සභා රැස්වීමෙන් ද අනුමත විය. ඉන් අනතුරුව අදාළ යෝජනාවලිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරිණි. එම නිසා "මේ සම්බන්ධයෙන් වන ඉදිරි ක්‍රියාමාර්ග 2013 මාර්තු මස අවසානය දක්වාම ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි" යන ප්‍රකාශය මේ අනුව සත්‍යයෙන් බැහැර වූවක් බව පෙන්වා දිය හැකිය.

### 5.3 අභ්‍යන්තර විගණනය

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් මෙහෙයවන ලදී.

### 5.4 අයවැය පාලනය

ආයතනයේ කාර්යයන් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අයවැය භාවිත කොට තිබුණි. 2012 වර්ෂය තුළ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ආදායම වැඩිකර ගැනීමට සහ වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු යොදා තිබුණි. ආනුෂංගිකව සලකා බැලීමේ දී 2012 වර්ෂය තුළ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ආදායම සහ වියදම අතර අයවැය හා සසඳා බැලීමේ දී ධනාත්මක වෙනසක් පෙන්වා ඇත. 2012 වර්ෂයේ තථ්‍ය ආදායම වැඩි වී ඇති අතර තථ්‍ය වියදම අඩු වී ඇත. මෙය ධනාත්මක ලැබීමකි.

### 5.5 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

2012.08.01 දිනැති උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියට අනුව සෑම වර්ෂයකම මැයි මස 31 වන දින වන විට වාර්ෂික වාර්තා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට බාර දිය යුතුය. සාමාන්‍යයෙන් සෑම වර්ෂයකටම දළ වාර්ෂික වාර්තාව සලකා බලන වර්ෂය අවසානයේ සකස් කරනු ලැබේ (සලකා බලන වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට පසුව).

2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත බාර දී ඇත්තේ 2012.08.29 දින වන අතර 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව සකසා (භාෂා ත්‍රිත්වයෙන්) දෙමළ පරිවර්තනය ලැබෙන තෙක් බාරදීමට සූදානම්ව තිබුණි. අවසන් පිටපතෙහි දෙමළ පරිවර්තනය බාහිර පුද්ගලයෙකු විසින් පරිවර්තනය කොට ඇත. ඒ සඳහා කල් ගත වී ඇත.

**6. පද්ධති හා පාලන**

(අ) පාඨමාලා මෙහෙයවීම හා ප්‍රතිඵල නිකුත් කිරීම
(ආ) කාර්ය මණ්ඩල බඳවා ගැනීම
(ඇ) අයවැය

පාඨමාලා මෙහෙයවීම, ප්‍රතිඵල නිකුත් කිරීම සහ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ අයවැය පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීමට අවශ්‍ය කටයුතු යොදනු ලැබේ.

ආචාර්ය එච්.වී.එම් රත්වත්ත
අධ්‍යක්ෂ/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය